

# ගිම්හානයේ කතාවක්

තවත් එක් සොඳුරු කතාවක්

තුමාෂා ශමින්දි ජයසේකර

# ග්‍රිම්හානයේ කතාවක්

තුමාෂා ශමින්දි ජයසේකර

# ගිම්හානයේ කතාවක්

## තුමාෂා ශමින්දි ජයසේකර

**කතෘගේ වෙනත් කෘති**

- හොඳ යාළුවෝ
- උපකාරය
- පුංචි නුවණට පුංචි කවි ගී
- දේදුනු කන්ද
- සමනලීගේ පැන්සල
- වනන්තරේ මිතුදම
- පුංචි කුමාරිකාවෝ
- රහස් පුස්තකයේ අබිරහස


මහාමායා බාලිකා විද්‍යාලය / මහනුවර

8-B (2024)



2025.02.08

**ISBN** 978-624-208-658-3

# _ පිදුම _

මතකයේ රැඳි දා පටන් සෙවණැල්ලක් සේ නිරතුරුවම මා සමග සිටිමින්,
මා කරන කියන සෑම කටයුත්තකට ම මට ශක්තිය ධෛර්ය ලබා දෙන
මාගේ මුල්ගුරුවරුන් වන
මා ආදරණීය දෙමව්පියන්ට හා නැන්දාටත්,
කුඩා කළ සිට නොදත් දෑ කියාදෙමින් මා සිප් නැණින් ඔපවත් කළ සියලූ ම
ගුරු මෑණිවරුන්ට හා ගුරු පියවරුන්ටත්,
ඉඳහිට වද කෙරුවද සෑම විටම මා හා එක්ව සිටින මාගේ ආදරණීය සොයුරියන් බඳු
මිතුරියන්ටත්,
වචනයකින් හෝ උපකාර කළ සියලු දෙනාටත්
මිහිරි ගිම්හානයක උණුසුම විඳිනට සාදර ඇරයුමක් කරමින්
සෙනෙහසින් යුක්තව මෙම කෘතිය
පුද කරමි !

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේ ම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **හෙරණගත්කරණී** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන් ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමාන ය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**ජීවිතයේ එක් පරිච්ඡේදයකට අනිවාර්ය වූ දුක්බර වූත්, ප්‍රීතිදායක වූත් ගිම්හාන උණුසුමෙන් පසු මිහිරියාවක සේයාවන් සෑම අන්දරයකට ම පොදු වූවක් ද? .....................**

**ඒ ලබා ගන්නට හෝ ලබා දෙන්නට පුරෝගාමියා වන්නේ කිවෙකුටත් නොපෙනෙන, නොදැනෙන විශ්වය ද? එසේත් නැතිනම් තමා ම හෝ තම සිතැඟියාවන් ද?..................**

***මදකට නැවතී සිතා බලන්න..!***

# 01

"චූටි නංගී.... තවම නැගිට්ටේ නැතිද ළමයෝ..?" ඒ වන විට ද නිදි මව් තුරුලේ පසු වූ දිල්නෙතු අවදි වූයේ එහා පස කාමරයේ සිටි සොහොයුරියගේ හඬ සිය දෙසවන් විදිගෙන නැගෙන විට ය. එනමුත් ඊට පිළිතුරක් නොදුන් ඈ නිදා සිටි ඉරියවුවෙන් ම සිය විසල් කාමරයේ දොර දෙස බලා සිටියා ය.

"අනේ, අනේ.. කම්මැලියා වගේ නිදාගෙන ඉන්න ලස්සන..." කාමරය තුළට හිස පෙවූ නෙහාරා නෝක්කාඩු කියන්නට වූවා ය. "අද ඉස්කෝලේ යන්න එහෙම හිතක් නෑ..?" ඕ දිල්නෙතුගේ පොරවනය ඇද දමමින් විමසුවා ය.

"යනවා, යන්..නවා......" කන්කෙඳිරි ගාමින් නැගී සිටි දිල්නෙතු පාසල් යාමට සූදානම් වීමට නාන කාමරයට වැදුණා ය.

* * *

දිල්නෙතු නානායක්කාර. මේ වන විට පහළොස් හැවිරිදි වියේ පසු වූ පවුලේ එකම දරුවාව සිටි ඈට සිය දෙමාපියන්ගේ සෙනෙහස අහිමිව තෙවසරක් ගෙවී ගොස් තිබුණි. ව්‍යාපාරිකයින් වූ ඇගේ මා පිය යුවල මීට වසර තුනකට පෙර ව්‍යාපාරික කටයුත්තකට යමින් සිටිය දී ඔවුනගේ කාරය මාර්ගයෙන් ඉවතට පෙරළී සිදුවූ අනතුරින් ඔවුන් දෙදෙනා ම මෙලොව හැර ගොස් තිබුණහ. එදින උදයේ සතුටු සිනහවෙන් යුතුව නිවසින් පිටව ගිය ඔවුනට නැවත එලෙසට ම නිවසට ඒමට ඉඩ කඩ නොලැබුණි. අතරමග දී සිදු වූ අනතුරු කොතෙකුත් දරුණු වූයේ ද යත් ගසක හැපී ගිනි ගෙන තිබූ කාරය තුළින් දිල්නෙතුගේ මවගේ මෘත ශරීරය හෝ සොයා ගැනීමට කිසිවෙකුට වරම් නොවී ය.

එතැන් පටන් දිල්නෙතු නීතියමයව තම මවගේ බාල සොයුරිය වූ සුනන්දා වීරනායකගේ භාරයට පත් වූවා ය. වෘත්තියෙන් කථිකාචාර්යවරියක වූ ඇගේ පුංචි අම්මා සෑම විටෙක ම වදනක හෝ වෙනසක් නොකර තමාගේ දරුවන්ට සේම දිල්නෙතුට ද එක ලෙසට සැළකුවා ය. ඇගේ දරුවන් තිදෙනා ම දිල්නෙතුට වඩා වයසින් ද වැඩි විය. නෙහාරා හැරුණු විට ඇයට වූයේ පිරිමි දරුවන් දෙදෙනෙකි. මේ වන විට අධ්‍යාපනය නිමවා සිටි පවුලේ වැඩිමහල් දරුවා වූ ධනංජන හා දෙවැනියා වූ නෙහාරා එක්ව ඔවුන්ගේ පියාට අයත්ව තිබූ ව්‍යාපාරයන් හැසිර වූහ. ඔවුනගේ පියා ද මීට වසර ගණනාවකට පෙර මිය ගොස් තිබුණේ හදිසියේ ඇති වූ හෘද රෝගයක් නිසාවෙනි. ඒ අතර ම පවුලේ තෙවැනි දරුවා වූ ලිවාන් ඒ වන විට දොළොස් වන ශ්‍රේණියේ ඉගෙනුම ලැබී ය.

ඔවුන් වාසය කරනුයේ මහනුවර වූ බැවින්, මවගේ හා පියාගේ ඇවෑම නිසා එතෙක් කාලයක් කොළඹ විසූ දිල්නෙතු එහි පැමිණි පසු ඇයට ඊට හුරුවීමට මදක් කල් ගතවි ය.මුල්කල නව පාසලකට යාමටත් තම සුපුරුදු මිතුරියන් නොමැතිව අලුත් මුහුණු රැසක් මධ්‍යයේ  තනි වීමටත් ඕ අකමැති වුව ද කල් ගත වන විට ඇය බොහෝ දෙනා සමග මිත්‍ර විය. වසර තුනක් ගත වීමෙන් පසු වුව ද දරුවෙකු ලෙස තවමත් ඇයට සිය මව්පියන්ගේ වියෝව දැඩි තනිකමක්, වේදනාවක් ඇති කළ ද ඇගේ පුංචි අම්මා, අක්කා හා අයියලාත් ඇව සතුටින් තැබීමට ඔවුනට හැකි උපරිමය සිදු කළහ.

මේ වන විට පසු ගිය ජනවාරියේ ඇය දහය ශ්‍රේණියට පා තබා මාස කිහිපයක් ගතව තිබුණු අතර ම මෙම දිනයන්හි ඇගේ පාසලෙහි කනිෂ්ට ශිෂ්‍ය නායිකා මණ්ඩලය සඳහා සිසුවියන් තෝරා ගැනීම සිදු කළ අතර, දිල්නෙතු ද මූලික වට දෙකෙන් තේරී පත්ව අවසන් වටය සඳහා සුදුසුකම් ලබා ගෙන තිබුණා ය. එබැවින් ඇගේ පුංචි අම්මාද ඉමහත් සතුටට පත්ව සිටි අතර හෙට දින ගුරුවරුන් පමණක් එක්ව කථිකාකර සිදු කරන අවසන් තෝරා ගැනීම් වටයෙන් තේරීමට ඉඩ ප්‍රස්ථාව සැලසුණහොත් අනිද්දා දින පැවැත්වීමට නියමිත කනිෂ්ට ශිෂ්‍ය නායිකා නිල ලාංඡන පැලඳවීමේ උළෙලට සහභාගී වන ශිෂ්‍ය නායිකාවන් අතර ඇය ද හිඳිනු ඇත.

ඉදින්, අද දින ද උදෑසන ම ඒ පිළිබඳ දැනුවත් කිරීමට රැස්වීමක් පවත්වන බවට සිසුවියන් දැනුවත් කර තිබූ හෙයින් දිල්නෙතුට ද වේලාසනින් ම පාසලට යාමට අවශ්‍ය විය. ඒ සඳහා අන් දිනයන්ට වඩා උදෑසනින් ඇව පාසලට කැඳවාගෙන යාමට නෙහාරා අනුමැතිය පළ කළේ ඈ සෑම දිනෙක ම උදෑසනම තම ආයතනය වෙත යාමට පිටත්වන බැවිනි. එනමුත් එම දින උදයේ දිල්නෙතු අවදි වන බවක් නොපෙනුණු නිසාවෙන් බලහත්කාරයෙන් ඇව සයනයෙන් මුදවා ගත් නෙහාරා ඇයව නාන කාමරයට යැවූයේ අඩ නින්දේ පසු වෙමින් ඕ තෙමේ තෙපලන්නා වූ නෝක්කාඩු බස්වලට සිනා නගමිනි.

*    *    *

“අනේ අප්පේ, අපේ වෙන්ඩ ප්‍රිෆෙක්ට් නෝනා....ඔහොම කම්මැළි වෙලා නම් බෑ!. කෝ,කෝ.. ලෑස්ති වෙලා ඉවර නම් ඉක්මනට එන්න.... කොහේ යන්නත්, මොනා

කරන්නත්, ඔක්කෝට ම කලින් හොඳට කාලා ඉන්න එපැයි..'' දිල්නෙතු ලැහැස්ති වෙමින් සිටින අතර පුංචි අම්මා කතා කරන හඬ පහළ මාලයෙන් නැගී ආවේ ය.

''එනවා පුංචී......'' පාසල් බෑගය ද අතට ගෙන තරප්පු පෙළේ දිව එමින් දිල්නෙතු හඬ දුන්නා ය. ''දැන් කන්න ගියොත් වෙලා යයිනෙ පුංචි, දැන් කකා ඉන්න බෑ.....'' දඩිබිඩියේ පුංචි අම්මා ලබා දුන් දිවා ආහාරය බෑගයෙහි ලා ගනිමින් දිල්නෙතු කීවා ය.

''එහෙම බෑ, අද කලිනුත් යන එකේ ටිකක් කාලා යන්න..... කලන්තයක් වත් එයි... ඔයාට ලෙඩටත් හොඳ නෑ.. මෙහෙ එන්න.'' දරුවන්ගේ ශරීර සෞඛ්‍ය සම්බන්ධව වැඩි අවධානයක් දක්වන පුංචි අම්මාගෙන් ගැලවීම දිල්නෙතුට කිරීමට අපහසු දෙයක් නොව කිරීමට නොහැකි දෙයකි. එහෙයින් බත් කටවල් කිහිපයකු මුව තුළ ලා ගත් ඇ පුංචි අම්මාට ද වැඳ කඩිනමින් නෙහාරාගේ කාරය වෙත දුවන්නට විය. ඇ එන තුරු බලා සිටි නෙහාරා ද ඇය නැගගත් විගස මෝටර් රිය ධාවනය කරවන්නට වූවා ය.

''අද එහෙම හවසට මොනවටවත් ප්‍රැක්ටිස් නෑ නේ? මෝටර් රථය පාසලට ළඟා වද්දී නෙහාරා දිල්නෙතුගෙන් විමසුවා ය.

''අද නම් මුකුත් නෑ,'' දිල්නෙතු සැහැල්ලුවෙන් ඊට පිළිවදන් දුන්නා ය.

''ම්ම්ම්ම්..... එහෙනම් හවසට බස් එකේ ගෙදර යන්න. පාර එහෙම මාරු වෙද්දි පරිස්සමෙන්..'' කාරය පාසල ඉදිරිපිට නවතමින් නෙහාරා උපදෙස් ලබා දුන්නා ය. වහා ඉන් බැස ගත් දිල්නෙතු දෑත් වනමින් තම ඥාති සොහොයුරියට සමු දුන්නා ය.

*   *   *

'' දිල්.!!....'' ගේට්ටුවෙන් ඇතුළුවත් ම දිල්නෙතුට මුණගැසුණේ ඇ එන තුරු මග බලා සිටි ඇගේ සමීපත ම මිතුරියන් වූ ජානුදායා සහ සඳසි ව ය. ඇ අද අනෙක් දිනවලට වඩා වේලාසන පාසලට පැමිණි නිසා ම එම මොහොතේ බෑග් පරීක්ෂා කිරීම සඳහා ශිෂ්‍ය නායිකාවන් ද නොසිටියහ. එහෙයින් සිය සුමිතුරියන් හා දවසේ පත්තරේ විස්තරය දිග හැරීම පිණිස අත්-වැල් බැඳ ගත් ඇ නාගරික පාසල්වලට සාමාන්‍ය වූ සිත්ඇද බැඳ ගන්නා සුලු කුඩා ක්‍රීඩාපිටිය හරහා පන්ති කාමරය වෙත ගමන් කරන්නට වූවා ය.

''ඔයාලගේ මීටින් එකට තව පොඩි වෙලාවක් තියනවනේ.. එතකන් ග්‍රවුන්ඩ් එක පැත්තේ ඉමු?'' එසේ යන අතර මග දී සඳසි අනෙක් දෙදෙනගෙන් විමසා සිටියා ය. ඇය ශිෂ්‍ය නායිකාවන් තේරීමට ඉදිරිපත් නොවූ අතර එසේ වුව ද සෑම විටකම තම මිතුරියන් දෙදෙනාට සහය දැක්වීමට ඇය පසුබට නොවූවා ය.

''ම්ම්...ඒක හොඳයි.''දිල්නෙතු ද ඊට එකඟ වූවා ය. කෙළෙසින් හෝ කතාවෙන් කතාව ඔවුන් පන්ති කාමරය තුළට ඇතුළු වන විට ද එහි තවත් පිරිසක් රැඳී සිටියහ. එය දුටු මිතුරියන් තිදෙනාගේ සේම, ඔවුන්ව දුටු අනෙක් පිරිසගේ ද මුහුණු තැලී පොඩි වුණු කජු ලෙලිවලට බෙහෙවින් සමාන විය. ''අද නම් දවස ම ඉවරයි වගේ..'' සඳසි ජානුටත් දිල්නෙතුටත් පමණක් ඇසෙන සේ මුමුණන්නට වූවා ය.

යෙශුනි ජයවර්ධන, බොහෝ දෙනා'තර අධිමානයෙන් හිස උදුම්මවා ගත්, දරදඬු නමුත් හීනමානයෙන් යුතු චරිතයක් වුව ද ඇව හිස මුදුනේ තබාගෙන අදහන පිරිසක් ද

ඈ වටා නොවුණා ම නොවේ. දිල්නෙතු එහි ඇතුළුවත් ම, මේසයක් මත සිටි ඕ අවට උන් සියල්ලන්ට කන වැකෙන සේ දිල්නෙතුව ඇමතුවා ය.

“ ඇයි මොකක් ද වෙන්න ඕන” නැති රණ්ඩු ද ඇති කර වීමෙහි සමත් සඳසි සිය යෙහෙළිය වෙනුවෙන් හැරෙන තැපෑලෙන් පිළිතුරු දුන්නා ය.

“දැන් කවුද මෙතන ඔයාට බුලත් දුන්නේ?” ඒ යෙශුනිගේ හඬ ය.
“දෙන්න ඕන නෑ.. මමයි ගත්තේ.” සඳසි ද එහිම ඇලවී උන්නා ය.

“තමුන් නෙවේ, මෙන්න මෙයා එක්කයි මට ප්‍රශ්නේ තියෙන්නේ..” සඳසි කිවූ දෑ මුළුමනින් ම නොසලකා හැරි යෙශුනි දිල්නෙතුගේ මග ඇසිරුවා ය. “මොකද මගෙන් වෙන්න ඕන ඔයාට.” යෙශුනිගේ ස්වභාවය දන්නා දිල්නෙතු සන්සුන් හඬින් විමසුවා ය. “වෙන්න ඕන ද? Junior Prefect Selection එකේ තමුන්ගේ application අයින් කරගන්නවා.. තමුසෙ හිතන් ඉන්නේ මාව බීට් කරලා ඉස්සරහට එන්න ද, මහලොකු දිළිහෙන තාරකාව.” යෙශුනි තම ඊර්ෂ්‍යාව හා කෝපය දිල්නෙතු මතින් දිය කර හැරියා ය.

“මේ යෙශුනි, අපිට ඔය කාවවත් පරද්දන්න කිසීම ඕන කමක් නෑ. සෝ, ප්ලීස් අපිට අපේ වැඩක් කරන් ඉන්න දෙනව ද.” ජානු දිල්නෙතුව, යෙශුනි අසලින් ඉවතට ඇද ගනිමින් පැවසුවා ය.

“හ්ම්ම්..... ඒක තමා. පරද්දන්න කෙසේ වෙතත්, සරණාගතයො උන පළියට අනුකම්පා කරලා තැන දෙයි කියල හිතන අයත් මෙතන ඉන්නවනේ...” යෙශුනි උපහාසාත්මකව කීවා ය.
“මොකද්ද ඒ කතාවෙ තේරුම?” සඳසි කැරලිකාර ලෙස විමසුවේ තම ඉවසීමට අන්තයක් සලකුණු කරමිනි.
“ තේරුම තමා...” ආපසු දිල්නෙතු වෙත හැරෙමින් යෙශුනි කෑගසන්නට වූවා ය. “මේ ඉස්කෝලේ කවදාවත් එහෙම ලේසියට මගදි ආව අයට ප්‍රිෆෙක්ට් ගන්න බෑ. අපෙන් අහන්න ඕන නෑ... ඔය එල්ලගෙන ඉන්න නැට්ටගෙන් ම අහ ගන්න. අම්මා තාත්තා නෑ කියලා ද තමුන්ට මට වඩා ලකුණු වැඩි උනේ... කොහෙද ඉඳල හත වසරට මගදි කඩා පාත් වුණ තමුන්ව මම එහෙම ලේසියෙන් අතාරින්නෙ නෑ... හොඳට මතක තියාගන්නවා! ප්‍රිෆෙක්ට් කෙනෙක් උනත් තමුන්ට නම් මම ඕන ඕන විදිහට වැඩකර ගෙන ඉන්න දෙන්නේ නෑ.”
“තමුන් ඉරිසියාවෙන් පුපුරනවා...” යෙශුනිගේ හඬ යටපත් වී ගියේ කෝපයෙන් කෙරුණු සඳසිගේ කෑගැසීමෙනි.

මීළඟට කිසිවෙකුත් කිසිවක් පැවසීමට පෙර අසල හුන් ජානුව ද පසෙකට කළ දිල්නෙතු පන්තියෙන් පිටතට දිව්වා ය. සිත් වේදනාව අන් අයගෙන් වසන් කරවීමට දිව ගිය ද අසල සිටියන්ට ඇය ඉකි ගසනා හඬ එහි සිටියවුන්ට මනා සේ සවන වැකුණි. ඒත් සමග ම “දිල්....!!ඔහොම ඉන්න..!”යි හඬ නැගූ සඳසි ද ඈ පසු පස වැටුණා ය. එනමුත් පිටවී යාමට හදිසි නොවූ ජානුදාා යෙශුනි ඇරඹූ කථාවට තිත තැබීමට ආපසු හැරුණා ය.

“යෙශුනි, කාට හරි දෙයක් හම්බෙනවා නම් ඒක අදාළ කෙනාට සුදුසු විදිහට, සුදුසු ප්‍රමාණයට හම්බෙයි. ඔයා කොයි විදිහට පෙන්නුවත් ඔයාට තියෙන්නේ ඉවසන්න බැරි ඉරිසියාවක්... ඔයා ඒකට අනිත් අයගෙ හිත් රිදවන එකෙන් ඔයා ඔයාගෙ තත්ත්වය නැති කරගන්නවා විතරයි....ඔයා ම හිතලා බලන්න ඔයාට ඒ වගේ දෙයක් වෙලා ඔයාට එහෙම කතාවක් අහන්න උනොත් ඒක ඔයාට කොහොම හිතෙයි ද? අම්මා තාත්තා නෑ කියලා ලකුණු දෙන කතාවක් කොහෙවත් නැනේ.... ඔයාටත් එයාට හම්බෙන දේම හම්බෙනවත්තේ.. දිල්නෙතු මෙහෙට හතේදි ආවට එයා කරන දේට එයාට සුදුසුකම් තියනවනේ... අනික ඉතින් එයා මෙහෙ එන්න කළින් හිටියේ අපෙ ඉස්කෝලෙටත් වඩා ලොකු ඉස්කෝලෙක...... හරි, ඒව මේව කොහොම උනත් ඔයා ආය කවදාවත්.. කවමදාකවත්.... කිසි ම කෙනෙක්ට නුසුදුසු දේ ඉස්සරහට දාලා කතා කරන්න කළින් දෙපාරක් හිතන්න. මොක ද එහෙම මිනිස්සුන්ට වඩා කැලේ ඉන්න සත්තුත් රත්තරන්.” ජානු ඉවසීමෙන් සිදු කළ කතාවට යෙශුනි පැවසීමට වදන් නොමැතිව තුෂ්නිම්භූත වී බලා සිටිය දී ම ඇ දිල්නෙතු සහ සඳසි ගිය දෙසට ම පිය නැගුවා ය.

*　　　　*　　　　*

“ දිල්.. අහන්නකෝ.. දැන් ඕක අමතක කරමුකො අපි. අන්න මීටින් එකට ළමයි ටෙරසස්වලට එනවා.... කෝ, අපිත් යමු....” දිල්නෙතුට හා සඳසිට එක් වෙමින් ජානු ද දිල්නෙතුට කියා සිටියා ය. දෑසට ඉනූ කඳුළු පිසදා ගත් දිල්නෙතු ද තම මිතුරියන් සමග හිඳි තැනින් නැගී සිටියා ය.

“අනේ මන්දා ජානු, මටත් හිතෙනවා වෙලාවකට මම මේ ප්‍රිෆෙක්ට් ඉල්ලුව එකෙන් තව කාට හරි ඒක හම්බෙන්න තිබ්බ අවස්ථාවක් නැති වෙන්න ඇත්ද කියලා” දිල්නෙතු ජානුදාාට කීවේ ඔවුන් අන් අයට එක් වීමට ටෙරසය වෙත යන විට ය. ඒ වන විට  සඳසි ඔවුනට සමු දී පංති කාමරය වෙත ගොසිනි.

“ඕහ්!!. දිලෝ.. ඔයත් වෙලාවකට හරි ම මෝඩ පැටියෙක්නේ.... ඔයාට ඒක ලැබෙන්න සුදුසු නිසානෙ හම්බුනේ....!! මැඩම්ලා මොකක් හරි විශේෂයක් දැක්ක අයවනේ මේකට select කරගෙන තියෙන්නේ. දැන් ඔයා ආයෙ හිතනවා නම් ඔයා third round එකෙන් අයින් වෙලා යයි කියලා ඒකත් කවදාවත් වෙන්නේ නෑ.... අපිට එක එක දේ කියන අයට පේන්න ම අපි ඉස්සරහට එන්න ඕන..” සෑම විටක ම අනුන්ට වඩා දෙයක් ගැඹුරින් දැකීමට සමත්, උපදෙස් සපයන්නිය වූ ජානුදාා දිල්නෙතු හට සැනසිලි බස් දෙඩුවා ය.

“හරි, හරි දැන් අපි මේක අතෑරලා දාමු..... එනව එනව යන්න... අද ආය මේ ගැන කිව්වොත් එහෙම ඔය ඔලු කට්ට ගලවලා මෙන්න මෙහෙම අතට දෙන්නෙ, හරිද?” ජානුදාා නාට්‍යානුසාරයෙන් කියා සිටි දෙයට දිල්නෙතුගේ මුවගට මද සිනහවක් එක් වූයේ යෙහෙළියගේ සිතට ද සැනසුමක් ගෙන එමිනි.

*　　　　*　　　　*

එලෙසට රැස්වීමට ද සහභාගී වූ ඔවුන් ආපසු පංතියට ගොස් සඳසි හා එක්ව එදින ඉතිරිය සාමාන්‍ය පරිදි විනෝදයෙන් ගෙවා දැමුවේ හෙට දින ගුරුවරුන් එක්ව ශිෂ්‍ය නායිකාවන් තේරීම කෙලෙස සිදු කරනු ඇති දැයි සිත්හි ඇතිව තිබූ කුහුල ද සමගිනි.

# 02

"ආ.. කොච්චි ආච්චි... මෙච්චර වෙලා කොහෙ ද හිටියේ?"
එම සන්ද්‍යාවේ පාසල නිම වී නිවසට පැමිණි දිල්නෙතු කිසිවෙකුත් නිවසෙහි නැති හෙයින් අලස බව මකා ගැනීමට පොතක් කියවීමට ගත්ත ද, අතරමැද දී නිද්‍රා මාතාව හා ගිවිසුමකට එළැඹි සිහින දෙව් දූ විසින් ඇව ගිල දමා තිබුණි. ඇගේ නින්ද කොතෙකුත් වීදයත් ඈ ආපසු අවදි වන විට හවසට හෙන්දිරික්කා මල් පිබිදෙන මොහොත ද පසු වී තිබුණි. ඈ පහළ මාලයට පැමිණෙන විට පුංචි අම්මාද ආපසු පැමිණ සිටි අතර ම ඇය මල කරදර ලෙස හඳුන්වාදෙන අයියලා දෙදෙන ද මුළුතැන්ගෙයට අරක්ගෙන සිටියහ.

"පොතක් කියෙව්වා අප්පා..... ඕන් නැති දෙයක් නෑනෙ ඉතින්." ලිවාන් නැගූ පැනයට පිළිතුරු ලබා දෙමින් දිල්නෙතු ඔහුට ඇද කළා ය.

"ම්ම්ම්....... පොත් ම කියවන්න ඇති. අපි එද්දිවත් පල්ලට නැවිත් ඔයා කියවන පොත මොකක් ද? ආය ඉතින් ගෙම්බන්ටත් අපහාසාත්මක වෙන විදිහට පොළවෙ ගහලා වගේ නිදාගන්න ඇති. හරි, ඒවා අදාල නෑ ඉතින් දැන්. කොහොම හරි ඉතින්.... තමුසෙට මේවගෙන් නම් බාගයයි ඉතුරු.." පුංචි අම්මා ගෙනා යමක් ඉහළට ඔසවා පෙන්වමින් ඔහු හිනැහුනේ ය.

"සීනි මුරුක්කු..!" යි බෙරිහන් දුන් දිල්නෙතු පැන්න සැනින් ලිවාන් අත වූ බැගය උදුරා ගත්තා ය.

"අයියෝ සංසාරේ...... කවුරු හරි දැක්කොත් හිතයි හත් අවුරුද්දක් හාමතේ ඉඳලා කියලා" පසෙක සිටි ධනංජන ද තම මල්ලීත් නංගීත් හා එක්වෙමින් පුටුවක හිඳ ගත්තේ ය.

“ අනේ,යනවා යන්න අප්පා.. ඔය දෙන්නා හොඳ නෑ...” සොහොයුරන්ගේ කතා බහට මුහුණ ඇඹුල්කර දැක් වූ දිල්නෙතු රස කැවිලිවලින් කොටසක් නෙහාරාට තබා ඉතිරිය ඔවුන් හා බෙදා ගත්තා ය.

“ඒ මේ. ඒක නෙවෙයි කොච්චි ආච්චි, ඔයා මොක ද කියන්නේ මේ අපේ ලිට්ල් ෆෙයිරි ගර්ල්ට තනියට තව කවුරු හරි ගෙනාවොත් එහෙම?” මදකට කැමෙන් මිදී මුවට විවේකයක් ලබා දෙමින් ධනංජන ඒ විමසුවේ ඔවුනගේ නිවසේ හිඳිනා බලු සුරතලා පිළිබඳව ය.

“මොකක්! ඕක නම් හීනෙකින්වත් හිතන්න එපා බුදු ලොකු අයියේ... මේකා මදි ද තව එකෙක් ගේන්න යන්නේ.....මේ ඊයෙත් මගේ අතේ කෑල්ලක් කඩා ගන්න හැදුවා. ඒකා ෆෙයිරි නෙවේ... ෆෙයිරිලාගෙ යකා...” ඇස් බෝල කරමින් නැහැය හකුළුවමින් දිල්නෙතු ඊට තම අකමැත්ත දක්වන්නට වූයේ බැරි වීමකින් හෝ තවත් බල්ලෙකු එහි ගෙන ආවහොත් සිදු විය හැකි ව්‍යසනයට බියෙනි. මොන යකෙකුට වුව ද බිය නැති ඇට බල්ලන්ට බිය වීමට සිදු ව ඇත්තේ මහපාර අයිනක ලෙඩ ගානේ වැටී සිටිනා බල්ලෙකු වුව ද ඇය දුටු සැනින් සැතපුමක් හෝ ඈ පසුපස පන්නන හෙයිනි. ඉදින්, ෆෙයිරි සම්බන්ධව ද තත්ත්වය එසේ ම වූ බැවින් ඔලුවෙන් සිටගෙන හෝ තවත් බල්ලෙකු ගෙන ඒම නැවැත්වීමට ඇය ඇප කැප වී සිටියා ය.

කෙසේ වුව ද දෙසොයුරන් එය අනුකම්පාවකින් තොරව ම ඈ මැඩවීමට යොදා ගනු ලබන්නේ එයට දිල්නෙතු බෙහෙවින් අකමැති බව දැනගෙන ය.

“ආ.......ඔයාගේ ෆෝබියාස් ඔක්කොම ඒ සතා පිට දාන්න එපා සූටි ආච්චියේ... කොහොමත් මට සීයට දාහක් ෂුවර් ඔය සත්තු තමුසෙ දැක්කම පන්නන්නේ උන්ට වෙන්න පුළුවන් කරදර ගැන හිතලා මිසක් ඔයාගෙ තිත්ත රහ බලන්න නෙවේ..” ලිවාන් කියා සිටියේ උස් හඬින් හිනැහෙමිනි.

“අනෙහ් මේ.. ආය අපිට බල්ලො එපා, ඒක මොනා උනත් කමක් නෑ.. ඔය දෙන්නා මට ආච්චි, ආච්චි ගාන එක නවත්තනවා හරි ද?” කන් කෙදිරිය පසෙක ලූ දිල්නෙතු ලිවාන් වෙත කඩා පැන්නා ය. “ඔය බලනවකො ඔයි, දත් හැළුණු ආච්චිලා වගේ නෙවෙයි ද කියලා දැන් මේ තමුසෙ කෑගහන්නේ..” යි කියමින් ලිවාන් ඇගේ පහරවල්වලින් බේරීමට හිස පහත් කරගත්තේ ය.

“ ආ... දැන් ඇති ඉතින් අයියලා නංගිලා දඟලවුවා.. චූටි දූ ආ තේ එක බොන්න.” එවේලෙහි එතැනට පැමිණි සුනන්දා පුංචි අම්මා දිල්නෙතුට තේ කෝප්පයක් දුන්නා ය.

“හෙට සිලෙක්ශන්ස්වලට ඔයාලවත් ගන්නව කිවුවද ?” ඒ අසල වූ පුටුවක අසුන් ගනිමින් ඕ දිල්නෙතු වෙත පැනයක් යොමු කළා ය.

“ආපෝ... නෑ.. ඒක මැඩම්ලගේ වැඩක්නෙ, අපිට අදාළ නෑ.. කොහොම උනත් හෙට 12ට කලින් තෝරාගත්ත අයව announce කරනවා කියලා නම් කිවුවා.”

“ඕක හිතන්න දෙයක් නෑ නෙතු නංගී.... තමුසෙගෙ කට කියවිල්ල දැක්ක ගමන් බැජ් එක රොකට් එක වගේ ඇවිත් නැවතෙන්නේ අතේ.... වෙරි සිම්පල්.” ධනංජන

නැගණියට ටොක්කක් අනිමින් පැවසීය. "අනේ මේ.. මම මේ ගෙදර වගේ වෙන තැන්වල කියවන්නෙ නෑ හරි ද." දිල්නෙතු හිස තදින් ගැස්සුවා ය.

"ආ..අම්මා! අර අනිද්දා පාටි එකට රෙඩි වෙන්නත් ඕනි නේද?" හිටි හැටියේ ලිවාන් ඒ විමසා සිටියේ රටේ ප්‍රමුඛපෙලේ ව්‍යාපාරිකයින් එක්ව සාමාන්‍යයෙන් වාර්ෂිකව පවත්වන අති උත්කර්ෂවත් උත්සවය පිළිබඳව ය. තම මවත් පියාත් සිටිය දී දිල්නෙතු ද ඒ සඳහා කිහිප විටෙක ම සහභාගී වී තිබුණ ද ඉන් අනතුරුව ම ඇයට ඊට යාමට කැමැත්තක් නොවී ය. එනමුදු මෙවර එයට නිවැසියන් සැවො ම යාමට තීරණය කර තිබූ හෙයින් ඇයට ද එහි යාමට සිදුව තිබුණි.

"අනේ, පුංචි මේ අහන්නකෝ.. මාත් ඕකට එන්න ම ඕන ද"

"ඇයි ඉතින්, මේ නිකන් ගෙදර ඉන්න එකේ ගිහින් එන්න යං.... අක්කයි ඔයයි දෙන්න ම කළිනුත් බෑ බෑ කියලා ගෙදර හිටියෙ... ඒකට මේ පාර දෙන්නව ම ඇදගෙන යනවා... සුනන්දා තම ඥාති දුවණියගේ හිස අතගාමින් කීවා ය.

"කොහොමත් නානායක්කාර බිස්නස් ගෲප් එකේ අනාගත ඕනර් උනාම මේවට පුරුදු වෙලා ඉන්නත් එපැයි..නේ අයියා.."ලිවාන් ද බැති සිතින් ඊට අත්වැල් බැන්දේ ය.

"අනේ..හහ්... මට නම් ඒ කම්පෙනි ටික තියා ඒකට ගෑවුන දෙයක්වත් මගේ කියලා ඕන නෑ... මන් ආස නෑ." ඒ පිළබඳ පවසන විට ඈ දෙමාපියන් සමග ගත කළ ආකාරය ගැන අතීත සිදුවීම් මතකයට නැගී ඇස් කෙවෙණි තුළට කඳුළු උනාගෙන එන විට දිල්නෙතු එක්වර ම කෑ ගසන්නාක් මෙන් කියා සිටියේ එක්වර ම සිතට ඇති වූ වේදනාව නිසාවෙනි.

"අයියෝ චූටි දූ.... එහෙම නෙවෙයි මැණික, මේ කටවාචාල කොල්ලා කියන දේ ගනන් ගන්න එපා.. ඔය විහිළුවටනෙ කියන්නේ...." පුංචි අම්මා සිය උපැස් යුවල'තරින් ලිවාන් වෙත නොපහන් බැල්මක් හෙළුවා ය. "අනේ අම්මා.. මං මේ නිකං කතාවට කිවුව එකත් මේ මෝඩි සීරියස් ගන්නවනෙ.." දිල්නෙතු වෙත එබෙමින් හේ කියන්නට විය.

"හරි මෝඩයා..මේ දැන් කතා කරද්දී මට ආච්චි කිව්වේ නැති නිසා මං සමාව දෙන්නම්. හැබැයි මට හෙට එද්දි මොනවා හරි කන්න දෙයක් ඕන." ලිවාන්ට ඇද කරමින් ඈ කියා සිටියා ය. "අන්න ඒක නම් හොඳයි නෙතූ... මූ ලාච්චුවේ මිටි ගහන් ඇත්තේ ඉතුරු කරන සල්ලි." ධනංජන බැතිසිතින් මල්ලීට කැපිල්ල දැමීමට අමතක නොකළේ ය.

"මම්ම්.... එකහායි.."

"හරි,හරි දරුවෝ... දැන් නෙහාරා එන්නත් වෙලාව හරි... උයන්නත් ඕන. ඔය කට්ටිය ගිහින් තියන වැඩක් කරගන්න" මුළුතැන්ගෙය වෙත යමින් සුනන්දා දරුවන්ට කීවා ය. "පුංචි මාත් එන්න ද?" දිල්නෙතු විමසුවා ය. " එපා එපා චූටි මැණිකේ... ආ ඊට කළින් ඔයා හිතලා කියන්නකො මොන වගේ ෆ්‍රොක් එකකට ද ඔයා ආස කියලා.. හෙට අයියයි අක්කයි ෂොපින් මෝල් එකට යනවා කිව්වා ඩ්‍රෙසස් බලන්න." තම කාමරයට යාමට තරප්පු පෙළ නගින විට පුංචි පවසනු ඈට ඇසුණි.

*                                        *                                        *

“අම්මා... මං ආවා....” ඒ සවස් වරුවේ ආයතනයෙහි වැඩ නිමවා නිවසට පැමිණි නෙහාරාගේ හඬයි. “අක්කා තමුසෙ මොකද වෙලා ගියෙ. අද අයියත් කළින් ආවා.” සාලයෙහි සෝෆාවට වී නිදිකිරමින් සිටි ලිවාන් ඇගේ හඬට උඩ ගොස් බිම වැටුණාක් මෙන් අන්ද මන්දව සිට විමසුවේ ය. “හෙටයි අනිද්දයි මං යන්නෙ නැති නිසා තියන වැඩ ටික ඉවර කරල ම ආවා....කෝ අම්මලා?” පුටුවක හිඳ ගනිමින් ඇ විමසුවා ය.

“ සුදු මැණිකේ... මේ ඔය නාගෙන ඇවිල්ලා නංගිට එහෙම පාටි එකට අඳින්න ආස මොන වගේ ගවුමක් ද කියලා අහගන්න. උදේට ඕවා කරන්න බෑ...” සුනන්දා ගේ තුළ සිට තම දියණියට පැවසුවා ය. “හා,හා....”

“ඒ මේ! අර.... ඇයි අම්මා ඔය පට පණුවො දෙන්නෙක් වගේ ඉන්න තමුසෙටයි නෙතුටයි මැණික මැණික ගාන්නෙ.. මේ හෙන හැන්ඩියට ඉන්න මටයි අයියටයි ජීවිතේට එයා එහෙම කතා කරලා නෑනේ.”ලිවාන් එක්වරම බොහෝ බැරෑරුම් දෙයක් මතක් වූවා සේ දෙබැම හකුළුවමින් අක්කාගෙන් විමසුවේ ය.

“ඇයි තමුසෙලා කෙල්ලො ද මැණික කියන්න.ඇහ්?.. කෝ බලමු. ම්හ්!. මැණික කියන එක නම් ඔයාට හරියන්නේ නෑ... කැමති නම් මං අම්මට කියන්නම් මගේ චූටි මල්ලියාට ආයෙ මැණිකා කියන්න කියලා......” නෙහාරා ඔහුට සරදම් කරන්නට විය.

“අනේ තමුසෙගෙ මහලොකු සත්ත්ව කරුණාව... NO! no.... No Thanks!”

“හාාා........... ඒ කියන්නෙ තමනුත් පිළිගන්නවා..?”

“මොකක් ද?!”

“තමුසෙ සතෙක් කියන එක...!!!! ගොඩක් ම හරකෙක් වගේ...?”

නෙහාරා තමා පසුපස පන්නාගෙන එන මලණුවන්ගේ පහරවල්වලින් බේරීමට සිය බල ප්‍රදේශය වූ තම සදාදර කාමරයට පැන දොර වසා ගත්තේ උස් හඬින් සිනාවෙමිනි.

*                                        *                                        *

“ පුංචි..! එහෙනම් මං යනවා..... පසුදා උදයේ පාසල් යාමට සූදානම් වූ දිල්නෙතු රෝහලට යාමට සූදානම් වෙමින් සිටි සුනන්දාගේ දෙපා නමදිමින් කීවා ය. “ ඔයාට බය වෙන්න දෙයක් නෑ චූටි දූ... මගේ කෙල්ල අද ගෙදර එන්නෙ ප්‍රිෆෙක්ට් කෙනෙක් වෙලා ම තමා... ගෙදර ආව ගමන් කෝල් එකක් ගන්න.. කොහොම හරි මං ආන්සර් කරනවා මොන වැඩේ තිබ්බත්... දූගෙ අම්මා තාත්තත් ඔයා දිහා බලාගෙන ම ඇත්තේ..... කිසි ම දේකට බය වෙන්න එපා. ම්.... ” ඈ කුඩා යුවතිය තුරුළු කර ගෙන ඇගේ හිස අත ගෑවා ය.

තම මවගේත් පියාගේත් සේයාරුවලට වැඳ දිල්නෙතු නෙහාරා සමග පාසලට යාමට සැරසුණා ය. “ලොකු අයියේ..පොඩි අයියේ..... අපි යනවා!” නිවසෙන් පිටතට ආ

දිල්නෙතු අයියලාට ද කැගසා කීවේ ඔවුන් බොහෝ දුරට තවමත් ලකලැහැස්ති වෙමින් සිටීමට ඉඩකඩ ඇති බැවිනි.

“ ඔහොම ඉන්ඩෝ......................” දිල්නෙතු පිටව යන බව පවසත් ම එහි දිව ආවේ ලිවාන් ය. “ හාාාහ්! අද මාත් එනවා.. කලින් ක්ලාස් එකට යන්න ඕන පොතක් ගන්න තියනවා........” හති අරිමින් හේ පැවසී ය.

“ඔයා ඉස්සරහට යන්න” ඉදිරිපස අසුන දක්වමින් දිල්නෙතු ඔහුට කීවා ය.

“ඕන් නෑ..”

“අනේ නගින්න, නගින්න....” බලහත්කාරයෙන් මෙන් ඔහුව එහි තල්ලු කරමින් ඈ පිටුපස අසුනට නැගගත්තා ය. එසැනින් මෝටර් රථය පණගන්වා ගත් නෙහාරා එය ගෙට්ටුවෙන් පිටතට පදවාගෙන ගියා ය.

අතර මගදී ඔහුගේ ලිවාන්ව ද බැස්ස වූ නෙහාරා දිල්නෙතුව ද පාසල අසලට ගෙන ආවා ය. නෙහාරා ඈට සුබ පතමින් සමුදුන්නේ සවසට පාසල අවසන් වී තමා හෝ ධනංජන පැමිණෙන තෙක් ගේට්ටුවට පිටතින් රැඳී සිටින ලෙසට ද දිල්නෙතුට මතක් කරමිනි.

# 03

එම දිනය දිල්නෙතුට පමණක් නොව ශිෂ්‍ය නායිකාවන් තෝරා ගැනීමට ඉදිරිපත් වූ සැමට ම පීඩාකාරී දිනයක් විය. ඉදිරිපත් නොවූව ද අනෙක් අය පවා බලා සිටියේ එහි ප්‍රතිඵල දැන ගැනීමට ය. බලා හිඳීමෙන් වෙහෙසට පත්ව සිටි දිල්නෙතු දහයයි තිහට ජානු හා සඳසි හා එක්ව දිවා ආහාරය ගෙන ඔවුන් ද සමග තම පොත්පත් රැගෙන මීලඟට ඇති විද්‍යාව ද්විකාලච්ඡේද සඳහා යාමට සූදානම් වූවා පමණි. පන්ති කාමරයේ එක් පසෙක සවි කර ඇති ශබ්ද විකාශන යන්ත්‍රයෙන් විදුහල්පතින්යගේ හඬ ඇසෙන්නට විය.

“මෙවර පාසලේ කනිෂ්ට ශිෂ්‍ය නායිකා මණ්ඩලය සඳහා ශිෂ්‍ය නායිකාවන් මේ වන විට සියල්ල තෝරා පත්කර ගෙන ඇත. මෙහි එන පත්‍රිකාවෙහි ඔවුන් සැමගේ නම් ඇතුළත්ව ඇත....”

සිරුර පුරා පැතිර ගිය හිරියක් ද සමග දිල්නෙතු හුන් තැන ම ඉද්ද ගැසුවාක් මෙන් නැවතුනා ය. අනෙක් අය ද ඉතා උනන්දුවෙන් නාම ලේඛනය අසා සිටින බව පෙනුණි. එය පන්ති වශයෙන් වෙන් කර තිබූ අතර මුලින් ම A පන්තියේ පිරිසගේ නම් පැවසූ පසු!........... “ 10 B ශ්‍රේණියෙන් තෝරා ගන්නා ලද ශිෂ්‍ය නායිකාවන්.”

“ඕ..... ළමායි... අහන් ඉන්න..... අපේ පන්තිය උඩින් ම ඇති.......!!” සඳසි හා තවත් කිහිප දෙනෙක් එක්ව කෑගසන්නට විය.

‘‘අනේ....’’ දිල්නෙතු ජානුගේ අත තරයේ අල්ලා ගත්තා ය. ‘‘බය වෙන්න දෙයක් නෑ.. ’’ ජානු නම් දිල්නෙතුටත් වඩා එය කියා ගත්තේ තමාට ම ය. දිල්නෙතුට නම් එය නොලැබී ගියා වුව ද ලොකු ගැටලුවක් නොමැත. එනමුත් ඒ ගැන කුඩාවට ලියලූ සියුම් බලාපොරොත්තුවක් ද ඈ තුළ නැතුවා ම නොවේ.

‘‘සෙයානා අසේනි, දිහේෂා මහානාම, යෙශුනි ජයවර්ධන....සංකල්පනා හේරත්’’ ‘‘ඕ...!’’ ඔවුන් වෙනුවෙන් නැගුනු විසල් අත්පොලසන් නාදයකි. මීළඟට...................

නිත්‍යා සේනානායක , ජානුද්‍යා වලිසේකර.. සහා........... දිල්නෙතු නානායක්කාර.....’’ ‘‘ඕ........ ඔය තියෙන්නේ......’’ සඳසි ඔවුන් දෙදෙනා වැලඳ ගනිමින් උමතුවෙන් මෙන් සිනාසෙන්නට වූවා ය.

‘‘ස්....මං හිතුවෙ නෑ ඇත්තට ම !’’ ජානු හිස දෙපසට වනමින් කීවා ය. ‘‘ අනේ.... තාම වෙලාවත් එකොළහයි.. මට පුංචිට කියන්න ඕන.....’’ දිල්නෙතු දැඩි සතුටකින් කියා සිටියා ය.

‘‘ඒක නෙවේ මේ, ඊළඟ පීරඩ් තියෙයි ද අපිට... නැති උනොත් හොඳයි..’’ ඔවුන් සමග සිටින තවත් මිතුරියක වූ දූලනි දෙඅත් එකට ගසමින් පැවසුවා ය. ‘‘ඒව හිතන්න එපා පුතේ..... මළත් මැඩම්ලා උගන්නන එක උගන්නනවා..’’ සඳසි කීවේ ඇයට ඇද කරමිනි.‘‘ආ මේ, අන්න ඔයාලට නම් 12.00ට ග්‍රවුන්ඩ් එකට එන්න කියලා..’’ ඒ අසල සිටි තවත් දැරියක් නිවේදනයේ දැක්වූ දෙයක් ඔවුනට කීවේ එය දිල්නෙතු හෝ ජානුට නෑසුණු බැවිනි.

පංතියේ ළමුන් සැවොම ද ඒ වන විට සතුටින් පිනා ගොස් කෑ ගසමින් සිටියහ. මඳින් මඳ එය වියැකෙන විට පන්තිය වෙත ගුරුවරයෙකු ද නොපැමිණි හෙයින් මේසය මත පලතුරු අලෙවි සලෙන් මිල දී ගත් අඹ මල්ලක් තබාගත් යෙහෙළියන් කතාබහේ යෙදෙමින් ම ඊට සාධාරණයක් ඉටු කරන්නට විය.

*                *                *

‘‘දැන් යං.. දොළහටනෙ එන්න කිව්වේ..’’ දිල්නෙතු ජානු ද සමග අනෙක් ශිෂ්‍යාවන් හා එක් විය.

එතැන් පටන් පාසල් අවසන් වන තුරු ම ජ්‍යෝෂ්ඨ ශිෂ්‍ය නායිකාවන් විසින් හෙට දින පැවැත්වෙන කනිෂ්ට ශිෂ්‍ය නායිකා මණ්ඩලයේ නිල ලාංඡන පැලඳවීමේ උළෙලට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් ඔවුන්ව ඒ සඳහා පුහුණු කරන්නට වූහ. පාසල අවසන් වීමට ආසන්න වන විට දිල්නෙතු ද මහත් වෙහෙසට පත්ව සිටියා ය.

සීනුව නාද වී ගාථා කීමෙන් පසු සඳසි සහ ජානු සමගින් ඇය ද ගේට්ටුව වෙත ඇදෙන සිසු කැල වෙත එක් වූවා ය. ඔවුන් දෙදෙනා තම තමාගේ බස් රථවලට නැගීමට ගිය අතර දිල්නෙතුව රැගෙන යාමට නිවසින් පැමිණෙන බැව් කියූ හෙයින් ඈ වැව රවුමෙහි වූ බංකුවක හිඳගෙන ඒ අසලින් එහා ඇදෙන ළමුන් අතරින් පාර දෙස බලා සිටියා ය.

“මේ නංගි,” කිසිවෙකු ඇගේ උරහිසට තට්ටු කරනු දැනී ඈ ආපසු හැරී බැලුවා ය. හිස ආවරණය වන තද පැහැ ජර්සියක් ඇඳ රතු පැහැ කැප් තොප්පියක් පැලඳ සිටි අයෙක් ඇගේ මග අවුරා සිටගෙන සිටියේ ඈ කළබලයට පත්කරමිනි. “අහ්?”

“ආ. මේ මම ධනංජනගෙ යාළුවෙක්. අපි මේ දැන් ඔෆිස් එකේ ඉඳන් ආවේ. සෙනග නිසා ධනා කිව්වා ඔයාව එක්කන් එන්න කියලා....” අමුත්තා මිතුරු බවක් මවා පෙන්වීමට වෙර දරමින් ගොරෝසු හඬින් කිවේ දිල්නෙතුට සැක ඇති කරමිනි..

“ආ...ම්.මේ... ම්...මං හ්..හිතන්නේ වැරදීමක්...අද අයියා ඔෆිස් ගියෙත් නැහැ. මට දැන් ක්ලාස්.. යාළුවෝ මාව හොයනවා ඇති... මං යනවා.. ” හැකි උපරිමයෙන් දැඩි ලෙස කියා සිටි ඈ එතැනින් දිව යෑමට සැරසුණ ද එම පුද්ගලයා වහා ඇගේ අත් බාහුවකින් අල්ලා ගත්තේ ය. “තමුන්ට හොඳ ඔලුවක් තියනවා නේද එතකොට... වැඩක් නෑ. අද අපි උඹව ඇරගෙනම තමා යන්නේ..ඒ නිසා දඟලන්නේ නැතිව හිටපන්” තමාගේ වදන්වලට ඈ නොරැවටුණු බව වටහාගත් ඔහු අල්ලා සිටි අත තද කරමින් ඇයට රහසින් කියා සිටියේ ය.

ඒ මොහොතේ ඒ අසල කිහිප දෙනෙකු ම ගැවසුණ ද සැකයක් ඇති නොවන පරිදි ඇව ග්‍රහණය කර ගැනීමට අමුත්තා සමත් විය. ඒ සමග ම අසල උන් ඔහුගේ තවත් සගයෙක් ඒ අසලට පැමිණි අතර ඔවුන් දිල්නෙතුගේ මුව ද අතින් ආවරණය කළ හෙයින් ඈ කිසිවක් කර ගත නොහැකිව අසරණ විය.

“මචං උඹ මේකිව අල්ලගෙන මේ ලේන්සුව හෙමීට මූනට තියපං. මං රජීයට වෑන් එක ගේන්න කෝල් එක දෙන්ඩ ඕන.ඉක්මන් කරපන්.”පළමුවැන්නා දෙවැනියාට අණ කරමින් දැරිය ඔහු වෙතට පත් කරන්නට සැරසුණේ ය. ඒ ක්ෂණයකින් ඔවුනගේ පාමාවක් බලා සිටි  දිල්නෙතු තදින් ඔහුගේ අත සපා කා අනෙකා සිදු වූ දෙය වටහා ගැනීමට මත්තෙන් මහත් වීර්යයක් ගෙන ඉවතට පැන්නා ය.

සිහිඑලවා ගත් අනෙකා නැවත ඇගේ බෑගයෙන් අල්ලාගත්ත ද ඊට පෙර ඈ උදව් ඉල්ලා කෑගැසීමට සමත් විය. ඒ අසල සිටි කිහිපදෙනකු ද එතනට පැමිණිය ද දිල්නෙතු අතහරවා ගැනීමට ඔවුන් කිසිවෙකුට නොහැකි විය.

“මැරුම්නොකා අතැරපන්...” දිල්නෙතුට මහත් සැනසිල්ලක් ගෙන එමින් ඇයට ඒ ඇසුණේ ධනංජනගේ හා ලිවාන්ගේ කටහඬවලුයි. ඔහු ගැසූ පහරට බියපත් වූ දුර්ජනයෝ දෙදෙන දිල්නෙතුව ද අතහැර දිව ගොස් වේගයෙන් පැමිණ නැවැත් වූ වෑන් රථයකට නැග පලා ගියහ. අයියා පසු පස ආ ලිවාන් වැටීමට ගිය දිල්නෙතුව වාරු කරගෙන කාරයට නංවා, එහි සිටි පොලිස් නිලධාරියෙකු හා කතා කරමින් සිටි ධනංජන වෙත ගියේ ය.

“ඒ ඕයි අයියා, මේක නම් ලේසි නෑ හැබැයි. උන් මේක හොඳට ප්ලෑන් කරලා කවුරුත් නැති වෙලාවක කරන්න හදපු වැඩක්... ඒත් උන් මොකට ද? කාටද? නංගිව උස්සන්න ඕන..?” ආපසු කාරය වෙත එමින් සිටිය දී ලිවාන් තම සොහොයුරාගෙන් විමසුවේ කල්පනාබරව ය.

“ම්ම්..... හිතන්න බෑ... කොහොමත් ආය මෙහෙම තනියෙන් තියන්න හොඳ නෑ. දැන්ම ම අම්මටත් කියමු ද?”

“ඔක්කොටෝ ම කළින් prefect තේරුණාද කියලා අහලා අම්මට කියලා ඉන්න වෙයි එයා අපිව මරන්න කළින්.” මෝටර් රථයේ පිටුපස දොර අරිමින් ලිවාන් උස් හඬින් තම සොහොයුරාට කීවේ ඔවුන්ගේ කතා බහ නැගණියට ඇසෙනු වළකාලීමට ය.

“අනේ! අයියා..... අර මිනිස්සු ගියාද? මී.මට බයයි......”වාහනයට නැඟී තම සොහොයුරන්ගෙන් ඕ විමසා සිටියේ ඉකි ගසමිනි.

“ආපෝ... මේන් මෙයා මෙහෙ ටැප් එක ඇරගෙන!.. උන් ගියා...... ඔය මොකක් හරි වැරදීමක් වෙන්න ඇති... කෝ අත රිදෙනව ද?” ලිවාන් දිල්නෙතුගේ හිසට තට්ටු කරමින් විමසුවේ ය.

“වැරදිලා නම් කොහොමද ? එයාලා අයියා ගැනත් කිව්වා....” ජනේලයට ඇණ තියා ගනිමින් දිල්නෙතු තෙපලුවේ වියවුලෙනි. “දැන් ඕක අමතක කරනවා මගෙන් ගුටි නොකා....ඒ මිනිස්සු සමහරවිට අපේ මලයකින්නි කියලා හිතලා තමුසෙව ඇරන් යන්න හැදුවා වෙන්න ඇති. එයා මිනිස්සු මරාගෙන කන්න හදන හැටියට ඉතින් නොකරොත්නෙ පුදුමෙ!.” විනෝදයෙන් පැවසුවද ලිවාන්ගේ කතාවෙහි ඇතුළත් වූයේ එම කතාව එතැනින් නැවතිය යුතු බවට අඟවන ස්වරයකි.

“ආ...පොඩි නංගී. ඕනම එක අමතක වෙනවා. ඔයා prefect තේරුණා ද... ආ..ආ පුංචිට කෝල් එකක් දෙන්න.” දිල්නෙතුගේ සිත වෙනතක යොමු කරවීමට ධනංජන තම දුරකථනය ඇට දෙමින් ඇසුවේ ය. තමා තේරුණු බව හැඟවීමට හිස සෙල වූ දැරිය සුනන්දාට ඇමතුමක් ගත්තේ සොහොයුරන්ට සැනසුමක් ගෙන එමිනි. සවස සිදු වූ කිසිවක් නොපැවසුව ද එහි සිට නිවසට පැමිණෙන තුරු ම පුංචි අම්මා හා ඇමතුමෙහි රැඳී සිටිමට ලැබීම පිළිබඳ ඈ දුරකථනයට ස්තූතිවන්ත විය.

*    *    *

“අම්මා.. ඔයා හිතනව ද හෙට පාටි එකට යන එක හොඳයි කියලා?...”රාත්‍රියෙහි ආහාර ගනිමින් සිටිය දී ලිවාන් තම මවගෙන් විමසුවා ය. සවස රාජකාරි නිම වී පැමිණ පසු සුනන්දා තම පුතුන් මාර්ගයෙන් සිදු වූ දෙය පිළිබඳ දැනුවත්ව සිටියා ය.

“මොනවා උනත් එහෙම යන්න හොඳ නැහැ. අපි නංගිව පරිස්සම් කර ගන්න ඕන පුතේ.. මොන වගේ එහෙකට ආව ද දන්නෙත් නෑ.. ගොඩක් ම ඒ බිස්නස්වලට වෙන්න ඉඩ තියනවා... අක්කලාටත් ගොඩ.. ඉරිසියාකාරයෝ හිටියනේ.. ඒ ආවේ කවුද කියන්න දන්නෙත් නැනෙ අපි  කවුරුවත්ම..” සුනන්දා කල්පනාබරව කීවා ය.

“එයාව හෙට ඉස්කෝලෙ යවනවද අම්මා?” නෙහාරා දිල්නෙතුගේ අඩක් විවර කර ඇති කාමරයේ දොර දෙස බලමින් ඇසුවේ කණගාටුවෙනි. ඈ වේලාසන ම ආහාර ගෙන නින්දට ගොස්  තිබුණා ය.

“හෙට යන්නම වෙයිනේ බැජ් පලන්දන නිසා.. හෙට උදේ ගිහින් දාලා ආය හවසට එකට විතරවත් යන්න. පව්, හොඳට ම බය වෙලත් ඉන්නෙ අහිංසකී..”

“හෙට පාටි එකටත් යන් නැනෙ කවුරුත්?” ධනංජන අවසන් තීරණය විමසුවේ ස්ථිරව ම දැන ගන්නට ය. “ඕන නෑ ලොකූ”...... සුනන්දා ඒ ගැන අවසාන තීරණය එලෙස දැක්වූවා ය.

“හ්හ්ම්..... මන් ගිහින් නෙතූ නිදිද බලලා එන්නම්.... මාත් නිදාගන්න ඕන..” අනතුරුව එළැඹී සුළු නිහැඬියාව බිඳ දමමින් කෑම මේසයෙන් නැගිටි නෙහාරා ඉහළ මාලයට යාමට තරප්පු පෙළට පිවිසුණා ය.

# 04

පසු දා දහසකුත් එකක් අවවාද මැද දිල්නෙතු පාසල් යාමට පිටත් වූයේ එදින පැවැත්වෙන නිල ලාංඡන පැළඳවීමේ උළෙලට සහභාගී විය යුතු නිසාවෙනි. එය නොවන්නට ගෙදර සිටින්නන් පෙර දා සිදුවීමත් සමග ඇයව නිවසින් පිටතට යැවීමටවත් නොසිතනු ඇත.

සුපුරුදු පරිදි ඇයට උදයේ ප්‍රවාහන පහසුකම් සැළසීමට ඉදිරිපත් වූයේ නෙහාරා ය. රැයේ යාමට සිතා සිටි සම්භාෂණයට ද නොයන නිසාවෙන් නිදහස්ව සිටි නිසා පාසල් අවසන් වීමට පැයබාගයකට හෝ පෙර එහි පැමිණෙන ලෙසට දිල්නෙතුට පැවසූ නෙහාරා එසේ නොවුනහොත් තමා එන තුරු පාසල ඇතුළත රැඳී සිටින මෙන් ද සමු ගැනීමට පෙර ඇට යළි යළිත් මතක්කර දුන්නා ය.

ශිෂ්‍ය නායිකාවක ලෙස නිල ලාංඡන පැලඳීමේදී නිල ඇඳුම හා පැළඳීමට ගෙන ආ තම බ්ලේසරය ද එක් අතකට ගෙන බෑගය කරට ගත් ඈ අක්කාට අත වනමින් පාසල් ගේට්ටුවෙන් ඇතුළට පිවිසුණේ එදින සාමකාමී දිනයක් වේවායි පතමිනි.

*   *   *

“ආ!මේ.. ඔයා, නංගී..... දිල්නෙතු, අපි රියසල් එකක් කරන්න යන්නේ.. ඔය බෑග් අයින් කරලා ඉක්මනට ඊයේ ලයින් එකේ ඔයාට දුන්න තැනට යන්න. ඉක්මනට!” ඈ පන්තියට යාමට පාසලේ වොලිබෝල් කෝඩ් එක අසලට පැමිණෙන විට එහි සිටි ජ්‍යෝෂ්ඨ ශිෂ්‍ය නායිකාවන් ඇව පෙර පුහුණුවීම් සඳහා ඇද ගත්හ.

පිළිවෙළින් එකා දෙන්නා පැමිණි පසු කිහිප විටෙක ම පුහුණු වීම් කළ පසු මදක් සැහීමට පත් වූ ඔවුන් උත්සවය සඳහා 7.30ට පැමිණීමට පවසා කනිෂ්ටයින් පංතිකාමර බලා පිටත් කළහ.

"මේ දරුවො, දිල්නෙතු.."

ජානු සමග පංතියට යමින් සිටි දිල්නෙතු අතර මග නතර වී යළිත් හැරී බැලුවේ යමෙකු ඇ අමතනු ඇසීමෙනි.

" මැඩම්."

ඒ කතා කර තිබුණේ ඇගේ පංතිභාර ගුරුතුමියයි. ඇ ගුරු විවේකාගාරය අසල සිට ඔවුන් දෙස බලා සිටියා ය. ඒ බව දුටු දෙමිතුරියන් කඩිනමින් ගුරුතුමිය සිටි ස්ථානයට දිව ගියහ.

"ආ... කීයට ද මේක පටන්ගන්නවා කිවුවේ පුතා...." ගුරුවරිය දැරියන් දෙස හොඳින් බලමින් විමසුවා ය.

"අපිට 7.30 වෙද්දි ග්‍රවුන්ඩ් එකට ඇවිත් ඉන්න කිවුවා මැඩම්..."

"ම්..හරි හරි..." " මේ, පුතේ දිල්නෙතු.... මට මේ දැන් ඔයාගේ පුංචි කතා කළා... ඔයාට ඊයෙ අර වෙලාවෙ මේ මුකුත් තුවාලයක් එහෙම උනේ නැනේ......?" වැඩි කතාවක් නොමැතිව එතුමිය තමා ඉදිරියේ සිටින සිසුවියගෙන් ඇසුයේ දියණියගේ ආරක්ෂාව සළකා සුනන්දා ඇට පැවසූ සිදුවීම හොඳින් පැහැදිලි කර ගැනීමටයි.

"අහ්, මේහ්.. න්..නෑ නෑ මැඩම්. ඒ.....ඒ.එහෙම මුකුත් උනේ නෑ..... එතකොට ම අයියලත් එතෙන්ට ආවා......." බලාපොරොත්තු නොවූ ආකාරයේ පැනය නිසා දිල්නෙතු මදක් කළබල වූවා ය.

"ඒ හවස උනා වගේ මීට කළිනුත් වෙලා තියනව ද?"

"න්.නෑ නෑ... මැඩම්"

"ආය එහෙම එක්කන් යන්න එන්න පරක්කු වෙලා තිබ්බොත් ගේට්ටුව ගාවට වෙලා ඉන්න පුතේ..... කරදර කියන ඒවා කියලා නෙවේනෙ වෙන්නෙ.... හදිස්සියෙ පාරෙ වාහනේකටවත් හැප්පුණා නම් කාට කියන්නද? හිතුවක්කාර වෙන්නත් එපා.... තේරෙනවනෙ ඉතින් දැන් පොඩි ළමයි නෙවේනෙ...?.."

"අ..ම්... ඔව් මැඩම්...." ජානුගේ ප්‍රශ්නාර්ථයක් රැඳි උවන දෙස ද බලමින් ඇ ගුරුවරියට පිළිතුරු බැන්දා ය.

"හ්ම්ම්... මොකක් හරි උවමනාවක් උනොත් අනිවාරෙන් කියන්න පුතේ..."

"හා හා...... දැන් එහෙනම් ඉක්මනට යන්න.. වෙලාවත් 7.05යි. අද වෙලාවක් නැතිවෙයි කියලා මම දැන්ම ම කතා කරේ... ඕව අමතක කරලා අද වැඩේ ගැන හිතන්නකො. දැන් යන්න පන්තියට දෙන්නම...." ඔවුන්ව යළි පිටත් කර හරිමින් ගුරුතුමිය ද තමාට අවශ්‍ය කටයුතු සිදු කිරීමට පිට වූවා ය.

"මේ දිල් මොකක් ද ඒ........ ඇයි ඊයේ.....?.."

" දැන් බෑ! යං ඉක්මනට." ජානු කළ විමසීම මගහැර දිල්නෙතු ඇයව ද ඇදගෙන පංතිකාමරයට දිවුවා ය.

*                                  *                                  *

පන්තිය යන අතරතුර දී ද ජානු පැනයන් නැගුව ද ඒ වන විට කතා කරමින් සිටීමට වේලාවක් නැතිවීම දිල්නෙතුට සැනසීමක් විය. පන්තියට ගිය සැණින් තම බෑගයන් ආදී බඩු බාහිරාදිය එහි දී සඳසිට භාර කළ ඔවුන් තම බ්ලේසර ද රැගෙන පිටිය වෙත දිව ආහ.

“හ්ම් හ්ම්.... ඔක්කොම හරි.. ඔයාලා ඉක්මන්ට ගිහින් කිවුව විදිහට පේළියට හිටගන්න... දැන් ළමයින්වත් ගෙන්නන්න හදන්නේ.....” උත්සවයේ කටයුතු භාරව එතැන සිටි ගුරුවරුන් හා ශිෂ්‍ය නායිකාවන් එක්ව ඔවුන්ව ප්‍රධාන ගේට්ටුව අසල සිට අනුපිළිවෙළට පෙළ ගැස්වූහ. ඒහි ගොස් සිටගත් ඔවුහු මදක් සසල වූ සිත් ඇතිව තමාට පහළින් ඇති භූමිය කුඩා මල් වැනි ශ්වේත වර්ණ දූතිකාවන්ගෙන් පිරීයනු බලා සිටියහ.

අවසන බොහෝ දෙනාගේ වෙහෙස මහන්සියෙන් සියලු දෑ සූදානම් කර ගත් පසු උත්සවය ඇරඹුනේ නව ශිෂ්‍ය නායිකාවන් ප්‍රීතියෙන් හා මද තිගැස්මකින් පුරවාලමිනි. ප්‍රධාන ආරාධිත අමුත්තිය ද එහි සපැමිණි පසු තූර්ය වාදනය මධ්‍යයේ ඉහළ පෙළ ගැසී සිටි තැන පටන් දිල්නෙතු ද අනෙක් අය හා එක්ව අර්ධ කවාකාරව ලාංඡන පැළඳවීමට පිට්ටනියට පැමිණ පෙළක් සාදා ගත්තේ අත්පොළසන් හඬ මැද ය.

ආගම ද සිහිකර ධජයන් ද ඔසවා විදුහල්පතිනියගේ හා ආරාධිත අමුත්තාගේ කථාවෙන් පසු..................

...............නවක කනිෂ්ට ශිෂ්‍ය නායිකා මණ්ඩලයේ ශිෂ්‍ය නායිකාවන් වෙත නිල ලාංඡන ප්‍රධානය කිරීමේ අවස්ථාවට ඒ සැමට මෙහි පැමිණීමට වේලාවයි මේ...............

පිටින් බලන්නන්ට නොපෙන්නුව ද, තමා කෙසේ පෙනේවි ද? ඇවිද යන විට ඇද වැටී බොහෝ දෙනා ඉදිරියේ ලැජ්ජාවට පත් වීමට සිදු වුවහොත් කුමක් කරන්නට ද? වැනි බොහෝ හාස්‍යජනක, අහේතුක සිතුවිලි සිතට නැගෙද්දී දිල්නෙතු ද තම නම කියවෙන තෙක් බලා උන්නේ චකිතයෙනි. අවසානයේ ඇයට ඉදිරියෙන් සිටි මිතුරිය ද නමත් සමග එතැනට ගිය පසු, ඊට පසුව සිටින තමා ශිෂ්‍ය නායිකාවක් නොවන බව පවසා ආපසු යවන ආකාරය ඇගේ දෙනෙත් ඉදිරියේ මැවෙන්නට විය.

ඒ කෙසේ නමුත් කල්පයක් පමණ වූවැයි ඇයට හැඟුණු සුළු මොහොතකට පසු ඇසුණේ.............

*දිල්නෙතු නානායක්කාර...................*

සිතට ඇති වූ සියුම් හිරිවැටීමක් ද සමග දිල්නෙතු තමා අබිමුව වූ පඩි කිහිපය නැග විදුහල්පතිනිය ඉදිරියට සම්ප්‍රාප්ත වූවා ය. තමාට ලැබෙන නිල ලාංඡනය තම නිල ඇඳුමෙහි ස්පර්ශවත් ම තමා පිට පැටවුණු වගකීම් රැසක හැඟුම් සමුදායක් ද සමග ඇය විදුහල්පතිතුමියට ද වැඳ ආපසු ඒමට හැරුණා ය.

එවිට අහඹුවකින් හෝ ඇගේ නෙත ගැටුණේ කුඩා ක්‍රීඩා පිටියට මදක් නුදුරින් පිහිටි බුදු මැදුරයි. උදෑසන සිසුවියන් විසින් පවිත්‍ර කර තිබූ එහි දකින්නන් සිත් නිවන, පහන් කරවන හැඟුම් ඇති කිරීමට තරම් පින්බර පෙනුමක් විය.

එයින් නිතැතින් ම ඇගේ සිතට නැගුනේ ඇගේ දෙමාපියන්ව ය.

“අම්මා.... තාත්තා ඔයාලා ඒක දැක්කද...?.. මම දන්නවා ඔයාලා මන් දිහා බලන් ඉන්නවා කියලා... ඔයාලගේ දුව ඉස්සරහටත් ඔයාලා දෙන්නා වෙනුවෙන් ම මහන්සිවෙලා වැඩකරනවා..”ඇයට පසුව සිටි ජානු ඇගේ වාරයේ දී පඩි පෙල නැග යන විට ඉන් බැස එමින් සිටි ඕ සුළු මොහොතකට පෙර ඈ අතට පත් වගකීම හුවා දක්වන රිදී පැහැති තහඩුපත දැඟිලිවලින් පිරිමදිමින් තම සිතුවිලිවලට කතා කළා ය.

අනතුරුව තවත් පැයක පමණ කාලයකට පසු උපදෙස් අවවාද හා අනුශාසනා මධ්‍යයේ උත්සවය අවසන් වූයේ සිසුවියන් සැමට නිදහසක් ලබා දෙමිනි.

* * *

“මේ, දිලෝ........”

“හ්මමම?”

“අර උදේ මැඩම් ඒ ඔයාගෙන් මොකක් ගැන ද ඇහුවේ ?”

එම උත්සවයට පසු දිල්නෙතු සඳසි හා ජානු සමග එක්ව දිවා ආහාරය ගනිමින් සිටිය දී උදෑසන සිදුවීම මතකයට නැගුණු ජානු හිටිහැටියේ ම පැනයක් නැගුවා ය.

“ආ..ම්,මේ.. ඒක ඒ හැටි දෙයක් නෙවේ. අපිට ඉතින් කතා කරන්න ඊට වඩා දේ තියනවානේ.” දිල්නෙතු විෂය වෙනස් කිරීමට වෙර දරමින් කීවා ය.

“ඒක එහෙම නෙවෙයි. ඔයා අපේ යාළුවා... ඊයේ මොකද්ද වුණේ කියලා අපිට කියන්නකෝ.”

ඔවුනගෙන් ගැළවීමට නොහැකි බව වටහාගත් දිල්නෙතු අකමැත්තෙන් නමුත් ඔවුන් ඉදිරියේ තම පෙර දා ඇති වූ ඇබැද්දිය දිගහැරියා ය.

“ස්ස්ස්..... අ න්.නේ..... බයේ බෑ.. අයියලාට එන්න පරක්කු වුණා නම් එහෙම!” “ඔයාලා දැන් හොයාගත්තද කවුද ඒක කරේ කියලා?” “පුංචි මොකද කියන්නේ?” “ අද පාටි එකට එන්නෙත් නෑ?” “අද හවස ඔයාව එක්කන් යන්න එනකන් අපිත් ඉන්නම්..” විස්තරය ඇසූ පසු කළබලයටත්, විස්සෝපයටත් පත් මිතුරියෝ දෙදෙන දිල්නෙතු වෙත නිම නොවන ගැටලු හා පිළිතුරු ඉදිරිපත් කළේ අසල සිටියවුන්ගේ ද අවධානය ඊට ඇද ගනිමිනි.

සැබැවට ම තමා හා සම වයසේ පසු වුව ද බොහෝ ගැටලු ආදියට මුහුණ පා සිටි තම මිතුරිය පිළිබඳව සඳසි සහ ජානු තුළ ද ඇත්තේ ඉමහත් වේදනාවකි. එම කාලය ගෙවී තිබුණ ද යළිත් ඇයට මීට පෙර කිසිදා සිදු නොවූ පරිදි සිදු වී ඇති එම සිදුවීම සවන වැකීමෙන් සැබෑ ම යෙහෙළියන්, සොයුරියන් ලෙස ඔවුන් දෙදෙනා බිය සංත්‍රාසය මුල් කොටගෙන සිත් කරදරයට පත් කරගත්හ.

“හ්ම්ම්.... ඔයා හැම වෙලාවෙම පරිස්සම් වෙන්න ඕන තමා. ඒ මිනිස්සු ඔයා පස්සෙන් එන්නේ ආන්ටී අන්කලුයි ඔයාගේ නමට ලියලා තියන බිස්නස්, ප්‍රොපටීස්

නිසා කියල ද හිතතන්නේ?'' සඳසි ඩෙස්කුවට ඇණතියා ගනිමින් විමසුවා ය. ඊට පිළිතුරු දෙනු වෙනුවට දිගු සුසුමක් හෙලූ දිල්නෙතු ඉවතට හැරුණා ය.

''හරි,හරි මේ ටික වෙලාව හරි ඕක අමතක කරලා හිනා වෙලා ඉන්නකෝ..''ඉන් පසුව ඒ පිළිබඳ කිසිවක් නොපැවසූ යෙහෙළියෝ එය අමතක කිරීමට ප්‍රයත්නය දරමින් පාසලේ ඉතිරි කාලය ගෙවා දැම්මේ දිලිනෙතු පිළිබඳ වද වෙමිනි.

# 05

සවස් වරුවේ පාසල් නිම වී බියෙන් පාසලේ ගේට්ටුව අසල සිටි දිල්නෙතු සැබැවට ම සැනසීමට පත්වූයේ එතැන නැවැත්වූ ධනංජනගේ කාරය දැකීමෙනි. ඔහු දිල්නෙතුව නිවසේ සිටි නෙහාරා වෙත ඇරලවා ආපසු තම වැඩ කටයුතු සඳහා ගියේ ය. සැහැල්ලුවෙන් නිවසට පැමිණි දිල්නෙතු නා පිරිසිදු වී ආහාර ගෙන කම්මැළිකම මකා ගැනීමට නෙහාරා හා ගෙවත්තෙහි ඇවිදිමින් සිටියා ය.

"අනේ අක්කා......! ඔයාවත් පුංචිට කියන්නකෝ මට එ..හ්ම්.. හෙට එකපාරට ම ගෙදර ඉන්න බෑ කියලා.. අද බැජ් එක ඇරන් හෙට ගෙදර හිටියම මැඩම්ලත් මොනවා කියයි ද දන්නේ නෑ..... අනේ...." ඒ අතරේ නෙහාරාට තමාව හෙට පාසල් නොයැවීමට ගත් තීරණය නවත්වන මෙන් පිණ්සෙන්ඩු වෙමින් දිල්නෙතු කන්කෙඳිරි ගෑවේ එදින පමණක් නොව තවත් කිහිපදිනක් ම එළෙස සිටීමට වේයැයි බියෙනි. ගෙදරට වී සිටීමට ඈ තුළ අකමැත්තක් නොතිබුණ ද එවිට පාසලෙන් කුමක් කියනු ඇත් ද යන්න ඇයට ගැටලුවක් විය.

"අයියෝ සුදෝ.... මේ අහන්නකෝ... එක දවසයි.... ලබන සතියේ යවනවා. ම්,මේ එක දවසක් කියන එක අහලා ගෙදර ඉන්න... ඇත්තටමයි කියන්නේ.... මේක කරපු විදිහත් එක්ක ඒ මිනිස්සු ටාගට් කරන්නෙ ඉස්කෝලෙ ගාව වෙන්න පුළුවන්.... අද නොයවා බැරීම නිසා යැවුවේ.. මැඩම්ලටත් ඉතින් විස්තරේ කියන්න බැරියැ. අම්මා අද ඔයාලගේ ක්ලාස් ටීචටත් ගත්තා කිවුවා... ඉතින් මේ තවම එදා මොකක් ද වුණේ කියලාවත් අපි දන්නේ නැනේ. ම්ම්.. මුරණ්ඩු වෙන්න එපා. ඒක ඔයාටමයි හොඳ නැත්තේ අපි ඔයාට කවදාවත් නරකක් කරන්නේ නැනේ.."

"ඒත් අක්කා ඔයාලා කියන විදිහට කරලා මට හ්!!...."

"ඒත්,මේත් කතා මුකුත් නෑ...! හෙට යවන්නෙ නෑ.බෑ... ඔයාට මේ බනිනවා නෙවෙයි, හිතන්නකෝ හදිස්සියේ කිසිම දෙයක් නොහිතා යන්නන්වාලෙ ගිහින් ආයෙත් අර වගේ දෙයක් උනොත් අපි මොනවා කරන්න ද? අඩු ගානෙ අපි හේතුවක්වත් අපි

දන්නව ද? ආ?... ඔයා ම දැන් මට ඒක කියන්නකෝ..." දිල්නෙතු ඊට විරුද්ධව දැඩි මතයකට එළඹ සිටියෙන් නෙහාරා මදක් සැර වූයේ එය කිසිසේත් ම සුළු කොට තැකිය නොහැකි නිසාවෙනි.

"අනේ මන් දන්නෑ අප්පා...."

"ඔයා දන්නේ නැකි හින්දා තමයි කියලා දෙන්නේ.. අහන්නෙ නැනෙ තියන හිතුවක්කාර කමට!"

"හ් හාහ්. ඒ උනාට අනේ අක්කී අර යෙශුනි එහෙම ඉන්නෙ... දන්නවනේ? හෙට නොයා ඉන්නවා කියන්නේ එයාට මට බැන බැන හින්ට් පාස් කර කර ඉන්න තවත් එකක් හම්බෙනවා... මං ආසම නෑ ඒකට... එයා ඒකට කියන ඒවා... ඒකයි මන් ගොඩක් ම බෑ බෑ කිවුවේ... ඔයත් ඒකට කෑගහන්න එපා... අනේ!! ඔයා මගේ අක්කනේ!.." නෙහාරා තමාට කෙදිනකවත් නොවූ ලෙස සැර කිරීම දිල්නෙතුගේ සිත රිද වීමට සමත් විය.

"ආයියෝ ඉතින් මං කිවුවේ ඇත්තනේ.... ඔයා මේ වගේ දේක දී මුරණ්ඩු වෙන්න යද්දි අක්කා විදිහට මට හුරතල් කරන්න බැනේ... මං එහෙම කතා කරපු එකෙන් මගේ චූටි අලි බබා නංගියාට දුක හිතුණ නම් සොරි!...ඔයා හොඳට මතක තියා ගන්න ඕන ඔයාට හැමකෙනෙක්ගෙන් ම වැඩියෙන්ම විශ්වාස කරන්න පුළුවන් ඔයාගේ පුංචියි, අයියලා දෙන්නයි, මමයි කියන එක. ඒ වගේ ම ඔය යෙශුනිලා කුණුශුනිලා වගේ අය කියන දේ ගණන් ගන්න එපා..තේරුණා ද?........
හරි හරි දැන් ඒක ඉවරයි හාද? කෝ එන්න අප්පා යන්න අපි දෙන්න අර අයියා මලෝ එන්න කළින් මොනා හරි තව අනං මනං මොනවා හරි කන්න දෙයක් හදා ගන්න......." දිල්නෙතු බොහෝ සේ කළබලයෙන් හා විස්සෝපයෙන් පසු වන බව තේරුම් ගත් නෙහාරා ඇගේ කර වටා අතක් දමා ගනිමින් ගෙතුළට යන්නට වූවා ය.

"හ්ම්ම්... ඒ....ඔයා මට අලි බබා කිවුවා."නරක් මූහුණක් දක්වමින් දිල්නෙතු කීය.
"එහෙම නොකියා වෙන මොනා කියන්න ද අනේ.. බරපතල දෙයක් කියද්දි මැට් කතා කියනකොට.. ආ.හා දැන් එන්න යං." දෙදෙනා ම එක්ව සමගිය පෙරදැරිව නිවසට පිය නැගූහ.

*　　　　*　　　　*

" චූටි දූ... ලොකූ... මං යනවා. පරිස්සමට ගෙදරට වෙලා ඉන්න.. දෙන්නා එක්ක ඇවිදින්න එහෙම යන්න එපා, ටවුමටයි අරෙහෙයි මෙහෙයි කියලා... පොඩි පුතා පොඩ්ඩක් මේ දෙන්න ගැන බලන්න." පසුවදා නිවසින් විශ්ව විද්‍යාලයට යාමට මත්තෙන් සුනන්දා නැවතත් දූවරුන් දෙදෙනාට අවධාරණය කළා ය. එදිනට ද දිල්නෙතු වෙනුවෙන් නිවසෙහි රැඳීමට නෙහාරා කැමති වූවේ ඇයට ද ඒකාකාරී ලෙස ආයතනික කටයුතු සිදු කිරීම ඇතිවී තිබූ නිසාවෙනි.

විද්‍යා විෂය ධාරාවෙන් ඉගෙනුම් කටයුතු සිදු කරන ලිවාන්ට ද මෙම දිනයන්හි වාර විභාග පැවැත්වෙන හෙයින් ඔහු ද නිවසේ රැඳුණේ පාඩම් කටයුතුවල නියැලීමට ය. එසේ නොමැති නම් ඔහුගේ පාසලේ ශිෂ්‍ය නායකයකු ද වන

හෙතෙම අමතර පංති නොමැති සෑම දිනෙක ම පාසල් යන්නේ උසස් පෙළ සිසුන්ට කාලය කා දැමීමට එය ඉතා හොඳ මාර්ගයක් බැවිනි. කෙසේ වුව ද අනුනට ද ආදර්ශමත් වන ලෙස තමාගේ අධ්‍යාපන කටයුතු ද සමබරව සිදු කරගැනීමට ඔහු සමතෙකු විය.

ධනංජන ද එදින උදෑසන ම කොළඹ බලා පිටව ගොස් තිබුණේ දිල්නෙතුගේ පියාගේ ව්‍යාපාරික ආයතනයේ වැදගත් වැඩසටහනක් සඳහායි. දිල්නෙතු තවමත් කුඩා වයසක පසුවන හෙයින් ඒවා පිළිබඳව ද තවමත් සොයා බැලුවේ ඇගේ ඥාතීන් ය. එලෙසම වැඩිමනත් ධනංජන එහි ගියේ තම මවගේ අදහසකට අනුව දිල්නෙතු පැහැර ගැනීමට ගත් උත්සාහයත් ව්‍යාපාරත් අතර සබඳතාවක් ඇතිදැයි විමසීමක් සිදු කර බැලීමට ද සිතා ගෙන ය. ඒ කිසිවක් පිළිබඳ වැඩි යමක් නොදත් දිල්නෙතු නම් තම පුංචි අම්මාත් අක්කා සහ අයියලාත් සමග විශ්වාසයෙන් කල් ගෙවුවා ය.

*　　　　　*　　　　　*

කලින් දවසෙහි දී ගෙදර හිඳින්නට අදිමදි කළ ද ඉඳහිට ලිවාන්ට ද වද දෙමින් අක්කාත් සමග විනෝදයෙන් සිටි ඇයට දවස ගතවෙන බවවත් නොදැනුණි. ඇයට ද ළඟ දී ම වාර විභාග පවත්වන බව දැනුම් දී තිබුණෙන් ඉතා අපහසුවෙන් වුව ද සුළු වේලාවකට හෝ පාඩම් කටයුතු සිදු කිරීමට ද අකමැත්තෙන් නමුත් ඕ ද කල්පනා කළේ නෙහාරාගේ උපදෙස් අධික වීම නිසාවෙනි.

කවරක් වුව ද සැහැල්ලුවෙන් දවස ගත කළ දිල්නෙතු තවත් ප්‍රීතියට පත් වූවේ සවස් වරුවේ ආ පුංචි අම්මා හෙට දින නගරයට යන බව පැවසීමෙනි. ඊට ඔවුනට තනිව යාමට සිදු වූයේ කොළඹ සිදු කරන වැඩ සටහන සඳහා ධනංජන එහි දෙදිනක් පමණ නැවතී සිටීමට තීරණය කර තිබූ හෙයිනි. එසේ ම එවැනි දෑට වැඩි මනාපයක් නොමැති ලිවාන් ද නිවසේ රැඳීමට සිතා තිබුණි. දිල්නෙතුව ඊට එක්කරගෙන යාම පිළිබඳ කිහිප විටෙක ම සාකච්ඡා කළ පසු ඇව ප්‍රවේසමෙන් රැගෙන යෑමට නෙහාරාත් පුංචි අම්මාත් එකඟතාවයකට එළැඹ සිටියහ. සැවො ම මෙලෙස කටයුතු කිරීමෙන් අපහසුතාවයට පත්ව සිටි අසරණ දිල්නෙතු ‘තමා බොහෝ දෙනාගේ දෑත්වලින් රැකී සිටින, බිම සිටුවා ඇති ලීයක මුදුනේ තබා ඇති ඕනෑම මොහොතක වැටීමට හැකි වීදුරුවක් ය..’ වැනි හැඟීමක පසු වූවා ය.

*　　　　　*　　　　　*

එතැනින් එළැඹුනු සති අන්තයේ එක් දිනයක් අවසන්ව උදා වූ ඉරිදාවේ සැන්දෑවෙහි දිල්නෙතු සිටියේ පෙර දා තමා පුංචි අම්මාත් අක්කාත් සමග එක්ව මිල දී ගත් පොත් පත් හා අනෙකුත් දෑ ඇගේ රාක්කයක අසුරමිනි. පොත් පත් කිවූව ද එහි වූයේ විෂයන්ට අනුගත පොත් පත් නොව විවිධ අයුරේ ඈ ආශා කරන නවකතා ආදියයි.

ඉතා කුඩා කළ පටන් ඈ පොත් කියවීමෙහි යෙදුණේ පිස්සුවෙන් මෙනි. බොහෝ කලෙක පටන් ඈ කියවන පොත් පත් තැබීමට සුනන්දා දැරියට පොත් රාක්ක කිහිපයක්

ම ලබා දී තිබුණා ය. එසේ මොනයම් හෝ ආකාරයකට ඇ ලබා ගන්නා පොත්වලින් දිල්නෙතුගේ පාඩම් කාමරයෙහි රාක්ක කිහිපයක් ම පිරීගොස් ඇත්තේ ඇව සතුටින් පුරවාලමිනි.

එම මොහොතෙහි ඇ සිටියේ ඇඳ පාමුලට වී දැනට ඇය සතු පොත් කුඩා ලියන පොතක සලකුණු කරමිනි. හැරී පොටර්, පර්සි ජැක්සන්, ඇන්, එමිලි වැනි නම් රැසක් එම ලැයිස්තුවේ විය. පොත් රැසක් ම ඇඳ පුරා තබා තබාගෙන එදෙසට නෙත් යොමා සිටි ඇගේ කල්පනා ලොව බිඳී ගියේ මීට මාස කිහිපයකට පෙර පුංචි අම්මා ඇට දුන් දුරකථනය කෑගසන හඬිනි.

ඒ දෙස බැලූ ඇ දුටුවේ තිරයේ සඳහන්ව ඇති ජානුගේ නමයි. ඇගේ ඇමතුමට හේතුවක් සිත සිතා දිල්නෙතු දුරකථනය අතට ගත්තා ය.

“ හෙලෝ!”

“ හෙලෝ නෙතුවෝ.....! මොක ද කරන්නෙ?”

“නිකං ඉන්නවා.. මොකද අවුල අද කවදාවත් නැතුව කෝල් ගන්නෙ..”

“මොකක්? ඇයි මෝඩි මං උඹට ඊයෙත් ගත්තෙ. පොළව පැලෙයි උඹ කියන බොරුවලට මනුස්සයෝ........”

“මං අපායෙ ගියත් යන්නේ උඹට පස්සෙ හරිත......”

“ඒ.... මං ගත්තේ අපායෙ යන දවස් දැන ගන්න නෙවෙයි බං.... දැක්කද මැඩම් group එකට දාලා තියන මැසේජ් එක?”

“මොන?”

“හෙට ඔයා එනවද කියන්නකෝ ඉස්සෙල්ලා..... ආ.. හරි! හෙට මේ.... මොකක්දෝ ගැන කියන්න තියනවා කියලා අපිට 2.30 වෙනකන් මීටින් එක්කට ඉන්න කියලා... ඔයා ඉන්නවද? නැත්තන් මං ඉන්නෙත් නෑ ...”

“ආ....හ් ඒනම් ඉන්න වෙයිනේ? මං පුංචිටත් කියලා හරියට ම කියන්නම්?”

“හුම්ම්.... තියාංකෝ මං ඒනම්..”

“හා හා.... බුදු සරණයි! කට ටිකක් පරිස්සමින්.. මැස්සොවත් බෝවෙයි..”

“අනේ ඉතිං මං කියන්නෑ.......හරි එහෙනම් මේං මං තිබ්බා. බුදු සරණයි.”

ඇමතුම විසන්දි කළ දිල්නෙතු පළමුව ඒ මේ තැන තබා තිබූ පොත් එක තැකනට කර පුංචි අම්මා සොයා පහත මාළයට දිවුවා ය.

“පුංචී...........................” සුනන්දාගේ කාමරය තුළ හෝ මුළුතැන්ගෙයි ඇය නොසිටි නිසා ඇයට අමතමින් දිල්නෙතු සාලයට යන්නට වූයේ එදින සවස කොළඹ සිට ආ ධනංජන ද සමග එහි සිදු වූ දෑ කතා කරමින් සැවොම එහි ඇතැයි සිතමිනි.

“පුං. . .ච්..” සුපුරුදු ඇමතුමෙන් කතා කරගෙන මුළුතැන්ගෙය අසලින් ඇති දොරෙන් ඇතුළු වීමට ගිය ඇ කන වැකුණු දෙයින් කුතුහලයට පත්ව නැවතුණා ය.

“ අනේ මන්දා අම්මා.... කොහොම උනත් මේක හරි භයානකයි... මට නම් නංගි ගැන හරි බයයි.... එයාට මේවා කියන්නත් බෑ එහෙම නොකියා අපි කියන දේ එයා කරන්නෙත් නෑ.....එදත් බෑ බෑ කියලනෙ ගෙදර හිටියේ.....” ඒ නෙහාරාගේ වදන් විය. ඒ වාගෙන් එතරම් දෙයක් නොකියවුණ ද මීළඟට ඇසුණු දෙයින් දිල්නෙතුගේ මුළු ඇඟ ම ශීතලට හැරුණි.

“ ඒක ඇත්ත අම්මා. ඊට කළින් අපි මේක හරි කියන්න තව කරුණු හොයා ගන්න එපැයි ඔක්කොටෝ ම කළින්..”

“අනේ මගෙ පුතේ... පුතාට විශ්වාසද ඒ ළමයා කිව්ව දේ...” පුංචි අම්මා අඬනු ඇසී පිටත අසා සිටි දිල්නෙතු විස්මයටත් බියටත් පත් වූවා ය.

“ අවිශ්වාස කරන්න දෙයක් නැනේ අම්මා.... ඌ මං පොඩි කාලේ ඉඳන් දන්න එකෙක්. මේ වගේ කේස් ගොඩක් බලලා මූට හෙන එක්ස්පීරියන්ස් එකක් තියනවා.. ශෙරාද් කියන විදිහට ම ලොකු අම්මගෙයි, ලොකු තාත්තගෙයි මරණෙත් ඒ තියන සාක්ෂි එක්ක මර්ඩර් එකක් වෙන්න තියන ඉඩ වැඩීලු.. එහෙම ගත්තම ඇත්තට ම මේකත් ඒකට ම සම්බන්ධ ඇති. නැත්තන් වෙන වෙන්න පුළුවන් දෙකුත් නැනේ...” තම ලොකු අයියා කියූ දෙයින් ඇති වූ කැරකෙන ගතිය මගහරවා ගැනීමට බිත්තියට වාරු වෙමින් බිමට රුටා වැටුණු දිල්නෙතු දෑසෙන් කඳුළු උල්පතක් ගලද්දීම ඒවා පිස ගැමට හෝ උත්සාහ නොගෙන දිගටම කතා බහට සවන් දුන්නේ සිතේ තමා පිළිබඳව ම උපන් සානුකම්පාවෙනි. “ඇගේ මවගේත් පියාගේත් මරණ කිසිවෙකුගේ

“ දෙයියනේ.... ඒක ඇත්තට ම එහෙම නම් අක්කා මොන විඳවිල්ලක් විඳවන්න ඇත්ත අර ගිනි ගොඩේ.... එයාටයි අයියටයි තිබ්බ ලොකු ම බලාපොරොත්තුව මේ අහිංසක කෙල්ල ඉස්සරහට එනවා දකින එක...” සුනන්දා කඳුළු පිසිමින් හීල්ලුවා ය. ධනංජනගේ ආරංචිය ඇව බෙහෙවින් කම්පා කරවීමට සමත් විය.

හ්ම්ම්..... ඒත් දැන් නංගි දහයෙ.. ඕලෙවලුත් ළඟයි.... ඉස්කෝලෙත් නොයවා ඉන්නෙ කොහොම ද?..”

“ එහෙම ම ඕන වෙන එකක් නෑ.. නංගිව පරිස්සමට වෙලාවට ගිහින් දාලා එක්කන් ආවනම් හරිනෙ. උන් වෙන කවුරුත් ඉද්දි එයි කියලා මන් නම් හිතන්නෑ..... අනික අපි එයාව ගෙදර තියාගෙන හිටියොත් එහෙම උන් දැනගන්නවා අපි මේක ගැන දන්නවා කියලා. එතකොට උන් තව පරිස්සමට වැඩ කරන්න ගයි. ඒක අපිට පාඩුයි.”

“ හ්ම්ම්හ්... අපිට එහෙම  කියන්න බෑ.... අපිට නංගිගෙ පරිස්සම හොඳට ම හිතන්න වෙනවා.....ඒත් ඕක දිගට ම තියෙන්නේ නැනේ. ප්‍රශ්නෙ විසඳ ගන්නකම් එහෙම කරමු..” ලිවාන් ද පළමුවරට කතා කරමින් කීය. එනමුත් ඒ කිසිවක් හොඳින් ග්‍රහණය කර ගැනීමට බිත්තියට පිට දී සිටි දිලිනෙතුට නොහැකි විය.

‘‘දැන් ඇති පුතේ... දැන් එයා තේ බොන්න පල්ලෙහාට එන වෙලාව.. ලොකු දුව ගිහින් එක්කන් එන්න නංගිව..’’ කතාවට තිත තබමින් එතැනින් නැගී සිටි සුනන්දා නෙහාරාට කීවේ ඇගේ පුතුන් දෙදෙනා ද කොහේදෝ යාමට නැගී සිටිද්දී ය.

‘‘අම්මා හිතන්න යන්න එපා.... අපිට පුළුවන් ඒවා බලා ගන්න.. ඊට පස්සෙ ඔයත් ලෙඩ වෙයි..’’ තම මවගේ කරට අතක් දමා ගත් ලිවාන් ඇගේ සිත සනසන්නට විය.

එම මොහොතේ පියවියට පත් දොරට එපිටින් හිදි අසා සිටින්නිය කළබල වී දෙකොපුල් තෙමමින් ගලා ඇති කඳුළු වැල් පිස දාමාගෙන වැටී සිටි තැනින් නැගිට ඉවත් වීමට හැදුව ද තෝන්තු ගතියකට පත්ව සිටි ඈ අසල වූ මේස කකුලෙහි පයවැදී මේසය ද පෙරළාගෙන ඇද වැටුණා.

‘‘මොකක්ද ඒ සද්දේ?’’
‘‘ඉන්න මං බලන්නම්’’

‘‘ග්හාහ්...... අනේ සුදූ........’’ ඇසුණු ශබ්දය කුමක්දැයි බැලීමට ආ නෙහාරා වැටී සිටි දිලිනෙතු අසල ඇනතියා ගත්තා ය. ඔවුන් කතා කළ සියල්ල ඇට ඇසී ඇති බව වටහා ගැනීමට නෙහාරාට නැගණිය වෙත හෙලූ එක් බැල්මක් සෑහිණි.

‘‘ඔයා ඇයි කතා කරේ නැත්තේ ඇවිල්ලා?... ඇයි දෙයියනේ අහගෙන හිටියේ.... ඔයා අඬනවද?.. අනේ මේ....කතා කරන්නකෝ.... නංගී....!!’’ තනිව කඳුළු සලමින් සිටි දිල්නෙතුව තුරුළු කරගනිමින් නෙහාරා විමසා සිටියේ කඳුළු බිඳු ඈ වෙතින් ද පිටතට පනින විට ය. ඒ සමග ම ඇගේ හඬ ඇසුණු අනෙක් තිදෙනා ද එතැනට දිව ආවේ කළබලයෙනි.

‘‘ආ. හ්..න්එ.... ඔයාල්ලහ් කියපුවා ඇහ්.හ්ත්ත ද...... අ න්එ හ්.. ඒවා බ්.. බොරු නේදහ්?... බ් බොරු කියන්නක් කෝහ්...! පුංචී......... අනේහ්..!’’ හැඬුම් අතරින් ම ඈ කෑ ගසා විමසුවේ සිත් වේදනාව දරාගත නොහැකිව ය.

කුමක් පවසම් දැයි සිතා ගත නොහැකිව ඔවුන් සැවොම මද වේලාවක් බලා සිටි අතර අඬා වෙහෙසට පත්ව සිටි දිල්නෙතු ඉකි ගසන්නට වූවා ය. මීට මොහොතකට ද පෙර සතුටින් සිටි ඈ ඒ වන විට දිස් වූයේ වැලපෙන මළමිනියක් මෙනි.

ඇව සැනසීමට වෙනත් මගක් නොවූයෙන් ඇව නිදන කාමරයට රැගෙන ගිය නෙහාරා ආහාර ද නොගෙන ඈ අසල රැඳුණා ය. වැලපීමෙන් හෙම්බත්ව සිටි දිල්නෙතු අවසන දිගු නින්දකට වැටුනේ ගතට ද වඩා සිතේ ඇති වෙහෙස සමගිනි.

# 06

---

“අද මොකද ඔයාලා හවස ඉඳලා ප්‍රැක්ටිස් කරේ?...” පාසලේ සවස ද රැඳී සිටි දිල්නෙතු මැලවුණු මුහුණින් කාරයට නගින විට නෙහාරා ඇගේ කොණ්ඩය ඇවිස්සුවා ය.

“සාහිත්‍ය දිනයෙ එක එක අයිටම්ස් ජූනියර් ප්‍රිෆෙක්ට්ස්ලට භාර දුන්නා.. ඒකට අපිව ටීම්ස්වලට බෙදන්න තියා ගත්තේ...” කෙටියෙන් පිළිතුරු දුන් දිල්නෙතු නිහඬ වූවා ය. නෙහාරා ද ආපසු ඇයව බලෙන් කතාවට ඇද ගැනීමට උත්සාහ නොකළා ය.

“නෙතූ...... මොනා හරි කන්න දෙයක් ඕන ද?” නගර මධ්‍යයේ පිහිටා ඇති විසල් අවන්හල අසල මෝටර් රථය නවතමින් ඇ නංගීගෙන් විමසුවා ය.

“ම්ම්හ්... මට මුකුත් එපා...අක්කට ඕන දෙයක් ගන්න.” දිල්නෙතු ආසනයට හිස තබා ගනිමින් මිමිණුවා ය.

ඇගේ සිත සැදීමට කළයුත්තක් සිතා ගත නොහැකිව දිගු සුසුමක් හෙළූ නෙහාරා උවමනා දෑ මිල දී ගැනීමට අවන්හලට පිවිසුණා ය.

*         *         *

“අම්මා... ඔයාට මිස්ට ගොඩකවෙල දන්නවා නේද?” එදින රාත්‍රියේ ආහාර ගනිමින් සිටිය දී ධනංජන තම මවගෙන් විමසුවේ ය.

“අහ්, ඔව් ඇයි? ඒ කම්පැණි එකත් එක්ක බිස්නස් එහෙකට ඉන්වෝල් වෙන්න ද?” සුනන්දා තම වැඩිමහල් පුත්‍රයාගෙන් විමසුවා ය. නෑ,නෑ එයාලා දැන් ඉන්නේ නුවර.. මට අද හම්බුණා. ලබන සතියෙ කැන්ඩිවල ඉන්න බිස්නස් කම්පැනිවලින් ෆන්ෂන් එකක් තියනවා. අපිටත් ඉන්වයිට් කරා...”

“හ්ම්ම්.. කවද්ද?”

“ලබන සෙනසුරාදා... ඒක නෙවෙයි, දැන් අත්තනායක අංකල්ලත් මෙහෙලු ඉන්නෙ...”

“කවු ද මේ.. ජයන්ති නැන්දලා?” ලිවාන් ද විමසුවේ දිල්නෙතු දෙස ද බලමිනි. ඔවුන් දිල්නෙතු පියා හා හවුල් ව්‍යාපාරයක් ගෙන ගිය අතර ඔවුනගේ අභාවයෙන් පසු ධනංජන පවසන ආකාරයට නුවර පදිංචියට පැමිණ ඇත. යළිත් ඒ පිළිබඳ කීමට යාමෙන් දිල්නෙතුගේ සිත පෑරේවි යැයි සිතා ඔවුන් එතැනින් එම කතා බහ නතර කළහ.

කෙසේ හෝ එවර පැවැත්වෙන උත්සවයට යෑමට දිල්නෙතු කැමති කරවා ගැනීමට සුනන්දා සමත් වූයේ ඇගේ සිතට මද සැහැල්ලුවක් තිළිණ කරමිනි.

*            *            *

“මේ...... අපි මොකක් ද අප්පා අර සාහිත්‍ය දිනේට කරන අයිටම් එක... නම්බුව යන්තමට තියා ගන්න තිබ්බ නම් ඇති..” පාසලේ විවේකයෙන් ගත කරන මොහොතක ඔවුන්ගේ පන්තියේ ම හිඳින ශිෂ්‍ය නායිකාවක වූ නිත්‍යා අනෙක් අයගෙන් ඇසුවේ ඈ බොහෝ කුතුහලයෙන් පසු වූ කාරණයකි.

“ම්ම්හ්... තව සතියයි තියෙන්නෙ නේද?” දිල්නෙතු ඇගේ කල්පනාවන්ගෙහි ම තනිව සිහිනයෙන් මෙන් විමසුවා ය.

“ ඒයි!” ජානු ඇට පහරක් ගසමින් කීවේ ඇව තිගැස්සී යන විට ය. “මොකද මන් අහන්නමයි හිටියේ... මෙකක් ද අවුල.. හැම තිස්සෙම මූණ එල්ලන් ඉන්නේ!”

“ආහ්? නෑ නෑ... අපි මොකද ඉතින් කරන්නෙ?”

“අදාළ නැති උනාට මාත් එන්නද අස්සකින් ඇඩ් එකක් දාලා යන්න..?” කොහේදෝ සිට එතැනට අඩුවට සිටි සඳසි ද ආවා ය.

“ම්ම්ම්..... මොනවා කරත් අර මහකුමාරිහාමිට වඩා හොඳට කරන්න ඕන..” නිත්‍යා යළි කීවේ යෙශුනි සිටි දෙස පෙන්වමිනි.

“මට මේක නිකමට හිතුණෙ.. හොඳද මන්දා.........” සුළු වෙලාවකට පසු දිල්නෙතු කීවේ සිය මිතුරියන් දෙස බලමිනි.

" ???? "

"මම්ම්...මේ.......short teledrama එකක් කරොත්?.."

"මරු!!!! මරු!..!.!" "ඒත් ඕක කරන්නෙ කොහොම ද දවස් හත අටකින්...?" "පුළුවන් වේද..!" "කොහොම ද?"

"ම්ම්ම්.... මන් කම්මැළි කමට ඉද්දි ලිවුව කතා එහෙ ම තියනවා.... ඒව ඔය හදලා ගත්ත ම ස්ක්‍රිප්ට් එක නම් හරි."

ආආහ්!

"ඕව ඔය කිව්වට පුළුවන් ද මන් අහන්නෙ"

"ට්‍රයි කරලා බලමු.. බැරි වෙන එකක් නෑ... ඔය කුණු කුණුව නවත්ත ගන්න ඉස්සෙල්ලා..!"

"මලිනිටයි, දිල්හානිටයිත් කියමු"

"දැන් කියකිය හිටියට වැඩක් නෑනේ. කොහොම ද කරන්නේ?"

"අපි පස්දෙනාමනෙ රඟ පාන්නෙත්..... ඒක එතකොට දෙබස් අපිට දවස් තුනෙන් විතර පුළුවන් වෙයිනෙ...... සඳාත් උදවු කරනවනෙ?"

"වීඩියෝ කරන්නයි, ඉතුරු වැඩ අයියලාට හරි අකක්කට හරි කියන්නම් මං...."

"ආ.. ආං අර විසබීජෙ... ඇහුණොත් එයාටත් කරන්න හිතුණා වෙයි.." සාකච්ඡා කවයට බාධා වූයේ එතැනින් යාමට පැමිණි යෙශුනි හේතුවෙනි.

"ආ..... ඉතින්! මොකද කතාව?" ඇ මග නැවතෙමින් උඩඟු ලෙස විමසුවා ය.

"අදාළ නෑනේ.."

"හ්හහ්ම්.. මොකක්ද කරන්න යන අයිටම් එක. කාවඩි ද?" සමච්චලයෙන් ඇ කිවූ දෙයට දෙදුරුම් කන පිළිතුරක් ලැබීමට ඉඩ තිබුණ ද එය වැලකුණේ එවේලෙහි ම පන්තියට ආ ගුරුතුමිය නිසාවෙනි.

පාසල අවසන්ව දිල්නෙතු නිවසට යන විට පෙර දිනවල වඩා ඇ සතුටින් සිටියා ය. එදින පුංචි අම්මා ද නිවාඩු ගෙන තිබුණේ ඇට උණක් වැලදී තිබුණු හෙයිනි. ඇගේ බල කිරීම නිසා ම පිරිසිදුවී පැමිණි දිල්නෙතු පුංචි සාදා තිබූ ඉඳිආප්ප කිහිපයක් කෑ පසු සිය කාමරයට වැදී ඔවුනගේ කෙටි චිත්‍රපටියේ පිටපත සැකසීමටයි.

අවසානයේ ලහි ලහියේ ඉතා සාර්ථක ලෙස එය ලියා අවසන් කර ගත් ඕ මීලඟට සූදානම් වූයේ ඇ සැමවිට ම ණයට උදවු ඉල්ලන දෙදෙනා වෙත යාමටයි. ධනංජනට කිරීමට ඕනෑ තරම් වැඩ කටයුතු ඇති හෙයින් ඇගේ නැවතුම වූයේ නෙහාරා සහ ලිවාන් ය. සිය බාල සොයුරියට මෑතකදී සිදු වූ සිදුවීම් අමතක කරවීමට ද එයින් සහයක් ඇති වේ යැයි සිතූ ඔවුන් ද ඊට නොපැකිලව කැමැත්ත පල කළේ පෙර පුහුණුවීම්වලින් පසු ලබන සිකුරාදාට එය පටිගත කරවීමට සූදානම් වන ලෙස කියමිනි.

# 07

---

“ආ… හරි හරි… තව ටිකක් ඉස්සරහට එන්න…. තව සද්දෙන් කියන්න…….. අන්න හරි.” සැමගේ ඔරලෝසුවල පස්වරු 2 ලෙස සටහන්ව තිබෙන මොහොතේ ඔවුන් සිටියේ නාට්‍යයේ වැව රවුමේ සිදු කරන පටිගත කිරීමක් සිදු කරමිනි. සියල්ලෝ ඉතා විනෝදයෙන් ඒ මේ අත දුවමින් සිටියේ කුඩා දරුවන් ලෙසිනි. ඊට ලිවාන් හා නෙහාරා මෙන් ම අනෙක් අයගේ සහෝදර සහෝදරියන් කිහිප දෙනෙක් ද පැමිණියේ ඉතා කැමැත්තෙනි.

කෙසේ වුව ද ගුරුවරියක ද ඒ සඳහා සම්බන්ධ කර ගත යුතු වන හෙයින් ඔවුනගේ පන්තිභාර ගුරුතුමියට සේ ම ශිෂ්‍ය නායිකා මණ්ඩලය භාර ගුරුතුමියට ද දැනුම් දීමට දැරියන් අමතක නොකළෝ ය.

එම කටයුත්ත එසේ සිදුවන අතරේ කෑමට මොනවා හෝ ගැනීමට දිල්නෙතු පාර හරහා කාරය වෙත ගියේ මුදල් ගැනීමට ය. ඇව බොහෝ දෙනා ගැවසෙන පෙදෙසේ අතේදුරින්වත් තනිව තැබීමට නොහැකි හෙයින් ලිවාන් ද ඈ පසු පස ගියේ නැගණියගේ ආරක්ෂාවට ය. ඔවුන් ආපසු එන අතරේ නිකමට මෙන් අසල පදික වේදිකාව දෙස බැල්මක් හෙලූ දිල්නෙතු පාර මැද ම ගල් ගැසුණේ වික්ෂිප්තව ය.

නැත.. නැත… ඈ වැරදියට එය දුටුවා විය යුතු ය. ඇගේ ඇස්වල දෝෂයක් තිබෙනවා විය යුතු ය.

ඇයට කෙසේවත් ඇගේ ආදරණීය මව මහමඟ දී හමුවීමට බැරි ය. ඈ තවදුරටත් දිල්නෙතු සමීපයේ නොසිටියා ය. එය මිරිඟුවකි. ඈ දුටු එම රුව තව දුරටත් එතැන සිටියේ නැත.

“නෙතූ…………………………” කිහිපදෙනෙක් යටිගිරියෙන් බෙරිහන් දී කෑගසන හඬ සමග කිසිවෙකු ඇව ඉවතට ඇද ගන්නා බව ඈට යන්තමට වැටහුණි.

“නංගි ඔළුව හොඳ නැද්ද? වාහන දැක දැක පාර මැද නවතින්නේ?” ලිවාන්ගේ කට හඬ ඇයට දෙසවන් අසලින් ම ඇසුණි. තවත් කිහිප දෙනෙකු එතැනට එන බව වැටහුණු දිල්නෙතු කම්පනයට පිය වී තිබූ දෙනෙත් යන්තමින් විවර කර ගත්තා ය.

“අහ්ම්...අ..අම්..මා....හ්..... එතන අම්මා හ්හිටියා.........” ඈ ගොතගැසුවා ය.

“නෙතූ...... ඉන්න. දැන් අපි ගෙදර යං.. ඔයාට තිබ්බ කොටස් ඉවරනෙ මේකෙ...” ඇය කතා කිරීමෙන් වැළැක් වූ නෙහාරා ඇයව වත්තන් කර ගත්තා ය. නාට්‍යයේ ඉතිරිය අනෙක් අයට භාර දුන් ඔවුන් දිල්නෙතුව ද රැගෙන නිවසට පැමිණියහ.

නිවසට පැමිණ මඳ වේලාවක් ගත වන විට දිල්නෙතු ක්‍රමයෙන් යථා තත්වයට පත් වූවා ය. ඇය පිටතට නොපෙන්නුව ද ඇතුළාන්තයෙන් බෙහෙවින් කඩා වැටී සිටියේ දහවල මායාවක් ලෙස හෝ දුටු දෙය නිසා ය. ඒ ඇය සැම විටෙක ම මව පියා ගැන සිතන නිසා ද? එනමුත් ඈට හැඟුනේ ම ඇය දුටුවේ සත්‍යයක් බවම ය.

ඇව සතුටු කරවීම සඳහා හැකි ඉක්මනින් ම නෙහාරාත් ලිවානුත් එක්ව ඇගේ නාට්‍ය නිර්මාණය අවසන් කරවා ඇයට බැලීමට දුන්නෝ ය. එයින් ද ඇය පිටතට පෙන් වූ තරමේ සතුටක් නොලැබුවා ය. ඇයට නිතර ම හැඟුනේ තමාට ඉතා වැදගත්, සමීප තමා දැන සිටිය යුතු ම යමක් තමාට මගහැරී ගොස් ඇති බව ය.

“සුද්දියෝ..........” ඇගේ කල්පනා ලොව බිඳී ගියේ නට නටා විසල් පෙට්ටියක් ද ඔසවාගෙන එහි ආ නෙහාරාගේ හඬිනි. “මේ... මේක දාලා බලන්නකෝ.... ඔයාට හෙට පාටියට යන්න අම්මා ගෙනත් තියෙන්නේ......” ඈ අත වූ පාර්සලය දක්වමින් කීවා ය.

“ම්ම්.... පස්සේ අඳින්නම්...”

“අයියෝ අහන්නකෝ.... අපිට තේරෙනවා ඔයාට දැනෙන විදිහ. ඒ උනාට ඔයාට හිත හදාගන්න වෙනවනෙ... ජීවිත කාලෙ ම ඔහොම ඉන්න බෑනේ? එහෙම නේ? ම්ම්..හ්...” දිල්නෙතුගේ උත්තරය භාර ගැනීමට නොසිතූ නෙහාරා කීවා ය.

“හ්ම්ම......”

“හ්ම්ම් හ්ම්ම්.. නෙවේ. කෝ එන්න මේක ඇඳලා බලන්න. එන්න..” දිල්නෙතුව ඇදගෙන කාමරයට ගිය ඈ ගවුම ද සමග ඇව ඇතුළට දමා දොර වැසුවා ය. අක්කාගෙන් බේරීමක් නොලැබෙන බැව් වටහාගත් ඈ පසෙක වූ පෙට්ටිය ඇර බැලුවා ය. එහි ඇතුළෙහි වූ ගවුම දුටු ඇයට සැබෑවට ම මුවගට සිනාවක් එක් විය.

රෝයල් බ්ලූ ලෙස හඳුන්වන තද නිල් පැහැති රෙදිවලින් නිමවා තිබූ එය වැඩි වැඩ නැති සරල, චාම් එනමුත් අලංකාර එකක් විය. ඈ එය හැඳගත් විට ඇගේ විලුඹ තෙක් දිගු විය.

“ඒඒ...ක ඔයාට මාර ලස්සනයිනේ.... ප්‍රින්සස් කෙනෙක් වගේ....” දිල්නෙතු දුටු නෙහාරා ප්‍රීතියෙන් පැවසුවා ය.

“ඕක දැන් ගලවලා තියන්න... හෙට අඳින්නත් කලින් කුණු ගාගෙන තියෙයි නැත්තන්..”

“අනේ මං එහෙම පොඩි ළමේක් නෙවේ හරි ද?”

“හලි හලි.. කෝ කෝ, ඕක මාරු කරලා එන්න යන් දැන්. කන වෙලාවත් පහුවෙලා...” දිල්නෙතුට උපදෙස් දුන් නෙහාරා ආපසු ඇව කාමරයට දැමුවේ සිය නැගනියව සුළුවෙන් හෝ සතුටු කිරීමට ලැබීම පිළිබඳ තුටු සිතින් යුක්තව ය.

රාත්‍රී ආහාරය අතරේ දුරකථන ඇමතුමක් ලබා ගත් නිත්‍යා පොඩි පොඩි ජර මර මැද්දේ ඔවුනගේ කෙටි නාට්‍ය ද සතුටුදායකව අවසන් කර සාහිත්‍ය සංගමයට යැවූ බැව් දිල්නෙතුට කීවේ ඇට ආපායෙන් ගොඩ ආවා වැනි හැඟීමක් ඇති කරමිනි.

කවරක් වුව ද කෙතරම් සතුටින් සිටිය ද දිල්නෙතුට දහවල සිදුවූ සිදුවීම අමතක කිරීමට නොහැකි විය. ඈ රාත්‍රී නින්දට යන විට පවා දෑස් ඉදිරියේ මැවී පෙනුණේ ඈ දෙස බලා හිද ඇට පිටුපා සෙනග මැද්දේ නොපෙනී ගිය සිය මවගේ මිරිඟුවක්වන් රුවයි.

*  *  *

පසු දා උදයේ දිල්නෙතු අවදි වූයේ එලාම් එකක් ලෙස නොනැවතී මහ හඬින් බුරන ලිවාන්ගේ ෆෙයිරි නිසාවෙනි. බලු සුරතලාට සේම ලිවාන්ට ද සිතින් බැන වදිමින් ඈ තම සිරියහනෙන් නැගී සිටියේ අඩක් විවර කර ගත් දෙනෙතින් යුතුව ය.

“අනේ මොකද අර සතා කන් ගැලවෙනකන් බුරන්නෙ?.......!!”

“අපෙ මල්ලි ෆෙයිරිගෙ කෑම එක කාලා වගේ....” දිල්නෙතු පහළට විත් නෙහාරාගෙන් විමසූ පැනයට පිළිවදන් දෙමින් නෙහාරා කොක්හඬලන්නට වූවා ය.

“අනේ....... ඔයාට හැමදේම විහිලු..”

“මොකෝ මේ උදේ ම තරහ ගිහින්...”

“ඒම නෑ.... මන් හරි නිවිච්ච ළමයා”

“හ්ම්ම්....ඒක තමා නේද?? මටනෙ වැරදිලා තියෙන්නෙ? එතකොට ඒක ද මගෙ සුදු නංගි හැම තිස්සෙම ලිස්සලා යන්නෙ??”

“ඇහ්?”

“නිවන දේවල්වලට සාමාන්‍යයෙන් ගන්නෙ වතුරනෙ..... ඉතින් ඔයා නිවුන කෙනෙක් නම් ඔයාට වතුර එක්ක සම්බන්ධයක් තියෙන්න එපැයි.... ඒකට හරියන්න ඔයා හැම තැනම වතුර වගේ ලිස්සලා වැටෙනවා.. නැත්තන් මොනා හරි අහද්දි ලිස්සලා යනවා......?” නෙහාරා කට හද හදා උරහිස් හකුළුවමින් දිල්නෙතුට ඇද කරමින් කියන්නට වූවා ය.

“මොක්..... ආාවු...” දිල්නෙතු අක්කා කිවූ දෙයට ඈ දෙස බලද්දී ඉවතට අඩිය තබා පඩිපෙළේ ලිස්සා වැටුණා ය.

“මන් කිව්වෙ.....”

නැගණිය වැටුණු තැනින් නැගිට ඈ පසු පස පන්නා එද්දී නෙහාරා කෑගසනා අතර ඈ තුළ වූ සිහිති බව මතු කරමින් ගේ වට දුවන්නට වූයේ මේසයක් ද පෙරලාගෙන ය.

*                    *                    *

එසින සවස් වන විට ඔවුනගේ වීරනායක නිවස පුරාම පැතිර ඇත්තේ මද නොසන්සුන් බවකි. දිල්නෙතුට මේකප් මදි බව කියමින් ඈ පසු පස දුවයන නෙහාරාත්, කූඩුවට දැමීමට ෆෙයිරිව අල්ලා ගැනීමට නොහැකි බැවට ලතවෙන ලිවාන් නිසාත් එම තත්වය වැඩි වන බව ඒ අසල පුවත්පත් වාර්තාකරුවෙකු සිටියහොත් පත්තරයට වාර්තා කරනු ඇත.

“පුතා ඔය බල්ලව කූඩුවට දැම්ම නම් එන්න... දුව නංගිට වද දෙන්න එපා එයාට ඔහොම ලස්සනයි....එන්න ඉක්මනට.....” සුනන්දා එළියට පැමිණ දරුවන්ට කෑගැසුවා ය.

“පුතා කළින් වැඩි නැනේ?”

“නෑ නෑ..... දැන් 4.30නෙ අම්මා...... 5ට පටන්ගන්නවා කිව්වේ... යද්දි 5.15 වත් වෙයි.” ධනංජන රියදුරු අසුනට ගොඩ වෙමින් කීවේ ය.

“ආාා..ම්මේ............. අම්මා මෙයා බලන්නකො අද... අර වෙනදා තියන මැර පෙනුම ඇත්තෙම නෑ..” දිල්නෙතුව දැක සැබැවට ම විස්මයට පත් වෙමින් ලිවාන් ඇස් කැරකුවේ ය.

“ඒඒ.....මහා කාගෙ හරි ඇදයක්මයි!” කාරය ගේට්ටුවෙන් පිටකට හරවන විට දී දිල්නෙතු කියවන්නට වූවා ය.

“චූටි දූ ඔය මෝඩයො ඉරිසියාවට කියන දේ ගණන් ගන්න එපා...”

කෙසේ හෝ එතැනින් ඇරඹූ අයියා නගෝ රණ්ඩුව ගමනාන්තය තෙක් නැවතීමට ඔවුන් කිසිසේත් ම සිතුවේ නැත.

*                    *                    *

“මේ හලෝ තමුසෙලා තුන්දෙනා මෙහෙ ඉන්න ටිකවත් පාඩුවේ ඉන්නවා හරි ද අම්මගෙයි මගෙයි සායම යවන්නෙ නැතුව” උත්සවය පවත්වන උත්සවශාලාවේ පිවිසුම් මගට ඇතුළුවද්දී ධනංජන නංගිලාටත් මල්ලීටත් තරවටු කළේ හැටි දැනගෙන ය. “ඕකේ බොස්!” ලිවාන් නක්කලයට පවසද්දී.. “තමුසෙගෙ යවන්න තියන සායම මොකක්ද කියවකෝ”යි මුමුණමින් නෙහාරා ඊට සහය වූවා ය.

ධනංජනට ඊට කිසිවක් කියා ගැනීමට නොහැකි වූයේ ඒ මොහොතේ එතැනට පැමිණි පුද්ගලයෙකු නිසාවෙනි.

“ඉතින් පුතා.”

“හොඳයි අංකල්.. මේ ඉන්නෙ මගෙ අම්මයි.. නංගිලයි.. මේ ඉතින් මගෙ එකම මල්ලී.. එතකොට මේ ඉන්නෙ මිස්ටර් ගොඩකවෙල... මේ පාටි එකේ ඕගනයිසර්”

“හ්ම්ම්... ඔය දරුවො ඇතුළට යන්න...” ඔවුන් වෙත සුහද සිනාවක් පෑ ඔහු ඔවුනට ආරාධනා කළේ ය.

ධනංජන ඔහු හා කතාවට වැටෙද්දී අනෙක් අය ඇතුළට ඇවිද ගියහ. එහි ඇතුළත සැබවින් ම අත්‍යාලංකාර ලෙස සරසා තිබුණි. “මෙතන ඉමු පුතේ... ඔහෙන් ඉඳ ගන්න.” ශාලාව කෙලවර විසල් මල් කළඹක් යට තිබූ ඉටිපන්දම් දැල්වූ මේසයක් දක්වමින් සුනන්දා කීවා ය.

“මං අයියා ඉන්න තැනට ගිහින් එන්නම්” කියා ලිවාන් ද එතැනින් ඉවත් වී ඔහුගේ මිතුරන් පිරිසක් සිටි තැනකට ගියේ ය. එහි ආ පසුව ම දිල්නෙතු වදනක් හෝ පවසා තිබුණේ නැත. ඇට දැනෙමින් තිබුණේ වචනයෙන් කිව නොහැකි ආකාරයේ හැඟුමකි.

ඈ එය මගහරවා ගැනීමට සිතා නෙහාරාට කතා කිරීමට සූදානම්වත්ම..........................

**“ඕඕඕ...........!!!! දිල්නෙතු දූ......**

**නෙතූ නංගී...?”**

# 08

එක්වර ම ඈ පසුපසින් උස් හඬින් ඇසුණු ගැහැණු කට හඬින් දිල්නෙතු තිගැස්සී ගියා ය.

ජයන්ති ආන්ටි!
උත්තරා අක්කි!

"මතකයි නේද තාම.." ඔවුන් අතරින් වැඩිමහලු කාන්තාව සිනාසෙමින් ඈ හට පැවසුවා ය.

ඒ විමසීමත් සමග සිත තුළ විවර වූ මතක ගමන් මගකින් එක්වර ම දිල්නෙතු අතීතයට දිව යන්නට වූවා ය. ඒ එතැන සිටියේ ධනංජන පෙර දාක නුවර පදිංචියට ආ බැව් කියූ දිල්නෙතුගේ මවගේත් පියාගේත් හවුල්කාර ව්‍යාපාරික පවුලයි. කෙසේ නමුදු ඒ දෙපළගේ අභාවයෙන් පසුව ම දිල්නෙතුට ඔවුන්ව හමුවී තිබුණේ නැත.

"අනේ.. ආන්ටිලත් දැන් මෙහෙ ඉන්නෙ කියලා අයියත් කිව්වා.. මෙහෙදි හම්බ වෙයි කියලා නම් හිතුවෙ ම නෑ...." කල්පනාව බිඳ දා ගත් දිල්නෙතු ඔවුනට සිනාවකින් සංග්‍රහ කරමින් කීවා ය.

"ඒක තමා දැන් ඔයා ලොකු වෙලා...දැන් තවත් කියුට් වෙලා...." ඈ අසලින් හිඳ ගනිමින් ඇගේ දියණිය පැවසුවා ය.

"ඉතින් සුනන්දා අක්කෙ!.. කොහොම ද? කොයි කාලෙකට පස්සෙද දැක්කෙ නේද?..." ජයන්ති නැමැත්තිය පුංචි අම්මා හා කතාවට වැටෙද්දී උත්තරා දිල්නෙතු හා නෙහාරාව ඇදගෙන වෙනතකට දිව්වේ සුනන්දා ද ඊට අනුමැතිය ලබා දෙන විට ය.

ආලෝකකරණය කර ඇති ශාලාවෙහි එක් පසෙක වූ වෙනත් මේසයක සිටි ඇගේ මිතුරියන් පිරිසක් වෙත ඔවුන්ව කැඳවාගෙන ගිය උත්තරා ඔවුන් අසල තිබූ

ආහාර කිහිපයක් ද ඔවුන් වෙත පැවා ය. නෙහාරා ද ඔවුන් හා කතාවට වැටෙන විට දිල්නෙතු පසෙකට වී බලා සිටියා ය.

"නෙතු නංගා... ඇයි අනේ පැත්තක ඉන්නේ... එන්නකෝ යන්න මන් ඔයාව උඩ හෝල් එකට එක්කන් යන්න....." හිටි හැටියේ ඇ අසලින් සිට ගනිමින් උත්තරා යෝජනා කළා ය. යෙහෙළියන් හා කතාවට වැටී සිටි නෙහාරාට නම් එම මොහොතේ ඒ පිළිබඳ වගේ වගක් නොවී ය.

"අනේ බෑ... අක්කිත් මෙතනනෙ.."

"අයියෝ එයා හිටපුවාවෙ. අපි යං.. මෙහෙ එන්න" දිල්නෙතුට කිසිවකට ඉඩක් නොතබාම බලහත්කාරයෙන් මෙන් ඇව ද ඇදගෙන උත්තරා ඉහළ උත්සව ශාලාවට පිවිසියා ය..

"අම්මා.. ඔයත් ආවද? මේ මන් නෙතුව එක්කන් ආවා.." එහි සිටි තම මව වූ ජයන්ති හට දිල්නෙතු පෙන්වමින් උත්තරා කීවා ය.

"කෝ කෝ එන්නකෝ.... කොච්චර කාලෙකින් ද ඉතින් හම්බුණේ... මේ බලන්නකෝ මෙතන කරුවලේ උනත් ජේන වීව් එකේ ලස්සන.. ඔයා ඉස්සරත් ආසයි නේද එහෙම රට එළිය බලන් ඉන්න.."ඇගේ හිස අතගාමින් ජයන්ති ඇව එහි වූ විසල් බැල්කනිය වෙත ආවා ය.

"ම්ම්..."

"දිල්නෙතු මොනවා හරි බොමු ද?" එක්වර ම මතක් වූවා සේ උත්තරා ඇගෙන් විමසුවා ය.

දිල්නෙතුට එම මොහොතේ දැනුණේ පරිසරයේ සීතලට ද වඩා වැඩි සීතලකින් තමාව වෙලාගෙන ඇති බවයි. හේතුවක් නොහැඟුණ ද ඇයට වුවමනා වූයේ හැකි ඉක්මනින් එතැනින් ඉවත් වීමටයි. නැවත පුංචි සහ අක්කා වෙත යාමටයි. ආපසු හැරී බැලූ ඇයට එතැන කිසිවක් පෙනුනේ නැත. විසල් විසිතුරු ශාකයක් ඇගේ දර්ශන පථය අවුරා තිබුණි. ඇ ජයන්ති නැන්දා හා උත්තරා සමග එහි තනිව සිටියා ය. බිය වීමට හේතු නොවුණ ද අසීමිත බියක් ඇ වටා විය.

**කොහේ නමුත් කුමක් හෝ වැරදීමක් සිදුව ඇති බව ඇට දැනුණි. කුමක් හෝ..... කොහේ හෝ.................. විශාල අතපසු වීමක්..... මගහැරිමක්.......................... ඇ එතැන තනිව ඇත...................**

ඇට බීම අවශ්‍ය නැත ඇට අවශ්‍ය වූයේ තම ආදරණීයයන් ය. **"පුංචි.. අක්කා.. .... අයියලා......ඒ හැර වෙන කිසිවක් / කිසිවෙක් නොවේ........."**

"ම්ම්...මට මුකුත් එප්පාහ්!! ම්ම්...මන් යනවා.... යන්න ඕන.!!" දිල්නෙතු එතැනින් දිවීමට තැනුවා ය.

"ඇයි අප්පේ.... මේ.......... ඇයි බය ද?"

"ජ්..ජ..යන්ති ආන්ටි!!!" දිල්නෙතු බිය වූයේ ඇ දරුණු කටහඬකින් ඇව අමතන විට ය.

“පැනල දුවන්න බෑ ළමයෝ..... කෑගැහුවට මේ සද්ද එක්ක කාටවත් ඇහෙන්නෙ නෑ... දැන් ඉතින් හොඳ හිතින් අම්මා තාත්තා ගාවට යන්න හිතුව නම් හරි....” සුරන්ගනා කතාවක මෙන් ගති ස්වභාව වෙනස් කරමින් ගැහැණිය දුෂ්ඨ සිනාවක් පෑවා ය.

“නෑ..... නෑ......... මන් පිළිගන් නෑ...... ඔහ්ය්යා ඔයා.....ලා..... නෑෑෑ................” යටිගිරියෙන් කෑගැසූ දිල්නෙතු සිහිඑලවාගෙන දුවන්නට වූවා ය.

“උත්තරා...! යන්න දෙන්න එපා....”

කුමක් හෝ දෙයක්...... කුමක් ම හෝ...........!! දිල්නෙතුට තම උරහිසින් ක්ෂණික වේදනාවක් සමග හිරිවැටීමක් දැනුණි. ඈ බිම ඇද වැටුණාක් මෙන් ඇට යාන්තමට වැටහුණි. ඇගේ හිස බමන්නට විය. “අහ්ම්මා...”

ඇට සිහිනයෙන් මෙන් තම මව තමා අසලට එනු බොඳවූ දෑසින් යුතුව පෙනුණි. එසේ ම ඈ කවදත් ඇසීමට ප්‍රිය කළ නාමය!

**‘මාදී....’**

දිල්නෙතු මන්දිරා නානායක්කාර.. ‘මන්දිරා’ ..... “**මාදි**”

ඈ යළි කිසි දා ඇසේ යැයි නොසිතූ නාමය, ඒ හඬ..........

ඒ ලෙස අමතමින් ඇගේ මුළු ලොව ම වූ කත ඈ අසලින් පහත් වනු පෙනෙන විට ඈ සිහිසුන් වූවා ය. ඇට පියවිය ඕනැවිය... එහෙත්.....

තමා මියගියා ද? තමා සිය මව් තුරුළට යළිත් නික්ම ගියා ද?

“අම්මාහ්...?...” ඒ ඇයට සිහිසුන් වීමට පෙර සිතට නැගුණු අන්තිම සිතුවිල්ල විය.

# 09

" අහ්! ම්ම්හ්ම්" දිල්නෙතුට දැනුණේ තම හිස මතට සීතල අයිස් අයිස් කැට තොගයක් හලා ඇතුවාක් මෙනි. ඇය දැස් පියන් විවර කර ගැනීමට උත්සාහ කළ ද ඒ මත බරක් පටවාක් ඇතිවාක් සේ ඇයට සිතුණි.

"අම්ම්හ්!" එකට ඇලී ඇති දෙනෙත් දිල්නෙතු දැඩි පිරිවැරයක් යොදා විවර කර ගත්තා ය. උගුර කට වියළී ඇති බැවින් කතා කර ගැනීමට ද නොහැක. උඩුබැලියෙන් වැතිර සිටි ඇ අපහසුවෙන් ගෙල පසෙකට හරවා ගත්තා ය.

"අහ්ම්මා!!!.." දෙනෙත් විසල් කරගත් ඇට කතා කරගත නොහැකි විය. ඔව්, ඇ අසල හිඳගෙන සිටියේ ඇගේ අම්මා ය. තමා දැන් සිටින්නේ එළොව ද? එහෙත් ඇගේ වටපිටාවට අනුව ඇට සිතී තිබුණේ තමා රෝහලක සිටින බව ය. පරලොව පවතින රෝහලක.. අපායේ??....

"මගෙ රත්තරන්.. ඔයා ඇහැරුණා ද දෙයියනේ!.." ඇගේ මව ඇ අසලට ළං වෙමින් කීවා ය. " අම්ම්...මා.. ඕ..යාහ්?" දිල්නෙතුගේ දෙනෙතේ ගැලුම්ගත් කඳුළු බිඳු ඇගේ කොපුල් තෙමමින් ගලා යන්නට විය.

"ෂ්ෂ්ෂ්! කතා කරන්න එපා මාදි...."

"අම්මාහ්... මට මොකද උනේ? මාත් ඔයාලා ගාවට ආව ද ? කෝ තාත්තා.." ඇ තම මවගේ රුවගත් තැනැත්තියගෙන් විමසුවා ය.

“ඔයා කොහෙවත් ගියෙ නෑ මැණිකෙ.. මමයි ඔයා ගාවට ආවේ.. ඉන්නකෝ මන් ගිහින් ඩොක්ටව හම්බවෙලා එන්න”යි කියමින් ඈ දිල්නෙතුව සිපගෙන එතැනින් ඉවත් වූවා ය.

ඒ අතරේ වෙහෙසකර බවක් දැක්වූ දිල්නෙතු නොදැනීම නින්දට වැටුණා ය.

*                    *                    *

දිගු නින්දකට පසු ඈ යළිත් අවදිවන විට බොහෝ පිරිසක් ඈ අසල සිටියහ. එහෙත් ඇගේ මව නොමැත... තමාට යළිත් ඇව අහිමි වූවේ ද? හිමි වූව ද එය කෙසේ විශ්වාස කරම් ද....?

“අම්මාහ්!!!” දිල්නෙතු ගොතගසමින් කීවා ය. “ඔහොම ඉන්න නෙතූ ලොකු අම්මා එළියේ ඉන්නවා...” ඈ අසල සිටි නෙහාරා ඉක්මනින් ඇව අල්ලා ගත්තා ය.

මද වේලාවකින් රෝහල් කුටිය තුළට පැමිණියේ පුංචි අම්මා සමග එක්ව ආ ඇගේ අම්මා ය. “අම්මා...” යළිත් තමාට ඇව නැති වේයැයි බියෙන් දිල්නෙතු සිය මව තදින් වැලඳගත්තා ය. ඈ රෝහලේ  සිටි ඉදිරි දින කිහිපය ද ඇගේ මව ඈ අසලින් ම රැඳී සිටිමින් කල් ගත කළා ය.

ඒ අතරේ උඩින් පල්ලෙන් ඔවුන් කියූ ආකාරයට ජයන්ති නැන්දා ඇගේ සිරුරට ඇතුළු කළ විසක් නිසා ඈ දින හතරකට ද ආසන්නව සිහිසුන්ව සිට ඇත. ඇගේ මවගේ යළි පැමිණීම හෝ ඇට ඉතා සමීපව සිටි ජයන්ති නැන්දාගේ වෙනස් වීම පිළිබඳ දිල්නෙතුට කිසිම අදහසක් නොවී ය. එසේ වුව ද කිසිවෙකුත් ඇයට කිසිවක් කීම ප්‍රතික්ෂේප කළේ ඈ තවමත් යථා තත්වයට පත්ව නොසිටි හෙයිනි. එපමණක් නොව ඈ බැලීමට පැමිණි ජානු හා සසි ද ඇව සතුටුදායක පුවතක් ගෙන ආවේ ඔවුනගේ නාට්‍ය හොඳ ම ඉදිරිපත් කිරීම ලෙස තේරීපත් වූ බවයි.

සතියකට පමණ පසු ඇගේ පවුලේ අයත් ඇගේ මවත් එක්ව දිල්නෙතුව ආපසු පුංචි අම්මාගේ නිවසට කැඳවාගෙන ආහ. සෑම විටෙක ම පාහේ ඇව තනි නොකිරීමටත් ඇව සතුටින් තැබීමටත් සියල්ලෝම සැදී පැහැදී සිටියේ දිල්නෙතුට විකට රැජිනක වැනි හැඟීමක් ඇති කරවමිනි. එය කොතරම් සතුටුදායක වූවේ ද යත් ලිවාන් ඇට පෙන්වීමට ගෙනා ෆෙයිරි දෙවරක් ම ඈ පසුපස පන්නා විත් තිබිණි.

*                    *                    *

දිනක් එවැනි සැඳෑවක දිල්නෙතු තම මව සොයාගෙන එළියේ වැරැන්ඩාවට පිවිසුණා ය. “අම්මා.... අනේ අදවත් එදා මොකද උනේ කියනවද මට?” මැණියන්ගේ උරහිසේ හිස හොවා ගත් දිල්නෙතු තම සිතේ පැවති කුහුල තම මව ඉදිරියේ දිගහැරියා ය. කිසිවක් නොපැවසූ නර්මදා නිහඬව ම සිය දියණියගේ හිස අතගෑවා ය.

“ඒ හැම දේට ම මුල ජයන්ති ආන්ටියි, වසන්ත මාමයි තමයි මාදි..” දිගු නිහැඬියාවක් බිඳ දමමින් ඈ අවසානයේ කීවා ය.

“මන් දන්නවා අම්මා.. ඒත් කොහොම ද? ”

නිවසට එපිටින් පෙනෙනා අහස දෙස බලා දීර්ඝ සුසුමක් හෙළූ නර්මදා දිගු කතාවකට මුලපිරුවා ය.

ගනුදෙනුවලදී සිදු කළ විශාල නීති විරෝධී කටයුතු හෙළිවීම නිසා කළබලයට පත්ව ඇයත් ඇගේ සැමියාත් ඒ සම්බන්ධ කටයුත්තකට යන අතරේ එය සිදුකළ ජයන්ති හා ඇගේ සැමියා ඒ පිළිබඳව බියට පත්ව පාලු පෙදෙසක දී ඔවුන් අනතුරට පත් කර එය හදිසි අනතුරක් බව පෙන්වීමට වාහනයට ගිනි තබන විට දී ද දිල්නෙතුගේ පියා මරුමුවට පත්ව සිටි බව ඇ මතකයට නැගුවේ කඳුළු පිරි දෙනෙතිනි. ඔවුන් පිටව ගිය පසු වාහනය ගිනි ගනිද්දී ඇති වූ පිපිරුමකින් දිල්නෙතුගේ මව එයින් පිටතට විසිව ගොස් තිබුණා ය. පාර පහළට වැටී සිටි ඇයව සොයාගත් විදේශිකයින් පිරිසක් දරුණු ලෙස තුවාල ලබා සිටි ඇයට ලංකාවේදී ලබා දිය නොහැකි වැඩිදුර ප්‍රතිකාර සඳහා ඇමරිකාවේ රෝහලකට ඇතුළු කර තිබුණහ. මාස කිහිපයක් ම සිහිසුන්ව සිටි ඕ හට සිහිය ලැබූ පසුව ද කණගාටුදායක ලෙස මතකය නැතිව සිට තිබුණා ය. මීට මාස දෙකකට පමණ පෙර ඊට සිදුකළ ප්‍රතිකාර නිසාවෙන් ඇ මදින් මද සුවපත් වන්නට ආරම්භකර තිබුණා ය. මුළුමනින් ම මතකය ලැබුණු පසු ඇයට පළමුව උවමනාවී ඇත්තේ වසර තුනකින් ම දැක නැති ඇගේ දියණියව දැක ගැනීමට ය. ඒ පැමිණි ගමනේදී මද අතපසු වීමක් නිසා වැව රවුමේ දී දිල්නෙතු ඇයව දුටුව ද සිය ගැලවුම්කරුවන් ද සමග එක්ව අවධානම් සහගතව තම දියණිය ඉදිරියට නොපැමිණ වැරදිකරුවන්ට දඬුවම් කරවීමට අවශ්‍ය සාක්ෂි සෙවූ බව ද ඇ කීවා ය.

නමුදු ව්‍යාපාරික සම්භාෂණයට දිල්නෙතුට පවා වෛර බැඳ සිටි ජයන්ති ඇතුළු උදවිය සහභාගී වන බව දැනගත් විගස ඇයට එසේ සැඟ වී සිටීම කළ නොහැකි විය. ඇගේ අනුමානයට අනුව හැකි විගස උත්සවය අතරේ එහි පැමිණි හෙයින් ඇයට මදක් පමාවී හෝ දිල්නෙතු වෙත ඒමට හැකි වී තිබුණි.

ඇසින් දුටු සාක්ෂි හා නර්මදාගේ කට උත්තරත්, ඇ එක් කරගෙන තිබූ සාක්ෂිත් නිසා සේම පුද්ගලයන් නොදත්ත ද ධනංජන හා ලිවාන් ද එම අනතුර මිනීමැරුමක් බව පෙන්වීමට සොයා ගෙන තිබූ සාක්ෂිත් නිසා වැරදිකරුවන් සියල්ලන්ට ම ඔවුනට උරුම සිරගෙයට යාමට මග පැදිණි.

“අනේ අම්මා....තාත්තා...” දිල්නෙතු කතාව අවසානයේ පවසන්නට වූයේ ඉකි බිඳිමිනි. “තාත්තත් අපි දිහා බලන් ඇත්තේ දූව..එයා ඔයා ගාව ඉන්න කාලෙ වගේ ම දැනුත් ඔයා ගැන සතුටු වෙනවා ඇති...” ඇගේ මව ඇව වැලඳ ගත්තා ය.

සවිමත් සිතකට ජීවිතයේ එක් දුක්බර කාලයක් යනු ගැඹුරින් හැදැරිය යුතු පොතක එක ම එක පරිච්ඡේදයක් පමණක් වන බව දිල්නෙතු කොහේ දී හෝ අසා තිබුණා ය. තමා ම තම අපේක්ෂා ඉටු කර ගැනීමට ඒවා හඹා යා යුතුය විනා එම අපේක්ෂා, සාර්ථකත්වය තමා සොයා නොයෙන බව කියමින් අතීත දිනවල තම පියා ඇව වැඩ කටයුතුවලට උනන්දු කරවූ අයුරු නිතැතින් ම ඇයට සිහි විය. එහෙත් මේ තමාට අඩක් ලෙස හෝ ලැබී ඇත්තේ ඇ හඹා යාමට නොතැනූ ඇ අතින් අත්හැරී ගිය සිහිනයක් නොවේ ද යන්න ඇ හැඟීම්බරව සිතන්නට වූවා ය.

දිල්නෙතු නම් වූ තවත් එක් යෞවනියකට අත්හැරීම කදිම ලෙස ඉගැන්වූ, ලද දෙයින් සෑහීමකට පත් වීමට හා ඉවසීමට මනා පුහුණුවක් ලැබූ, ලැබිය යුත්ත කෙලෙස හෝ ලැබෙන බව තේරුම් කරවීමට සමත් වූ, එනමුදු සිහිනයක් බඳු වූ, කඳුළින් නමුත් සවිමත් සිතින් ගෙවූ, එම මිහිරි ගිම්හානය නිමා වූවේ මෑතක් තුරා කඳුළු ගංගා මැවූ දෙනෙතුන් තුටු කඳුළින් දිළිහෙන නෙතු පබළු බවට හරවමිනි.

ඉහළ නීල වර්ණ ආකාශය දෙස නෙත් යොමා මෙතුවක් කලක් තමා ලැබූ අත්දැකීම් සිහි කළ දිල්නෙතුට සිතුණේ සමහරෙකුට ඇතිවෙන දුක් පීඩා ආදිය සැලකූ විට තමාට සිදු වූ දෑ අල්පෙනිත්තක තරමේ දෑ බව ය.

මෙයාකාර සිතුවිලි සයුරක ගසාගෙන යන අතරේ කෙදිනක හෝ තමා ද තම ජීවිතය දිනා ඇගේ මවට මෙන් පියාට ද ආඩම්බර විය හැකි සාඩම්බර දියණියක් වන බවට තමාට ම පොරොන්දු වෙමින් දිල්නෙතු සිය සදාදර මවුන්ගේ තුරුළේ උණුසුමට ගුලි වූයේ ජීවිතයේ එක් වකවානුවක ගමනක් නිමාකර නව පරිච්ඡේදයක සාර්ථක ආරම්භයකට විශ්ව මාතාවගේ ආශිර්වාදය ද ඈ වෙත ලැබෙන විට ය............

...නිමි...

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ලුන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂූ භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන් ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකු ලබන ආස්වාදය අන් කිසිවකින් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේ ම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන්ට ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනවිරත්න මහලේකම්

*කටු පිරි දිවි ගමනේ*
*රෝස මල් පිපි එක් මගක යමින්*
*තබන තබන පියවරක් පාසා*
*පෑරී ඇදුම් කන දෙපය ඉවසමින්*
*ඉදිරියට ඇවිද යන්නනි!*

**අවසනදී කෙදිනක හෝ වසන්තය ඔබ සොයා එනවා විශ්වාසයි.**

*ඉවසන්න....!*
**ඉවසීම** ලොව ඇති ප්‍රභලත ම ප්‍රතිකර්මයයි.

**ගිම්හානයේ**
**කතාවක්**
*තුමාෂා ශමින්දි ජයසේකර*

**ISBN** 978-624-208-658-3